# පාලි භාෂාධ්‍යයන ප්‍රවර්ධනයෙහි ඇති කාලීන අවශ්‍යතාව පිළිබඳ විමර්ශනයක්

ආචාර්ය දිවුලපැලැස්සේ විමලානන්ද හිමි

## පාලි භාෂාව

සම්බුද්ධ දේශිත ථෙරවාදි ත්‍රිපිටකය සංගෘහිත භාෂා මාධ්‍යය තන්ති, නිරුක්ති, මගධ හා පාලි යන පර්යාය නාම කීපයකින් ම අර්ථවත් වූ ශ්‍රේෂ්ඨතම භාෂාවකි. ක්‍රි. පූ. 06 වෙනි සියවසේ භාරතයේ විවිධ ප්‍රාදේශීය උපභාෂා පැවැති අතර ඒවා මධ්‍යතන ඉන්දු ආර්ය උපභාෂා වශයෙන් සැලකේ. එහෙත් බුදුරජාණන් වහන්සේ විසින් ස්වකීය දේශනා පැවැත්වීම සඳහා භාවිත භාෂා මාධ්‍යය කුමක්දැයි විමසුවහොත් ඍජුව පිළිතුරක් දීමට භාෂා ශාස්ත්‍රඥයෝ අපොහොසත් වෙති. එහිදී උන්වහන්සේ විවිධ ස්ථානයන්හි විවිධ පුද්ගලයන් අරභයා ඔවුන්ට අවබෝධ වන අයුරින් උපභාෂා කීපයක් ඇසුරින් දේශනා පවත්වන්නට ඇතැයි උගතුන් ඉදිරිපත් කරන මතය වඩාත් සාධාරණය.[1]

බෝසත් උපත, සම්බුද්ධත්වය, ප්‍රථම ධර්මදේශනය පැවැත්වීම, පරිනිර්වාණය වැනි වැදගත්ම සිදුවීම් කිසිවක් සිදුනොවූ මගධයේ බුදුන් වහන්සේ වැඩිම කාලයක් ගතකරමින් ධර්ම ප්‍රචාරන කටයුතු සිදු කරන ලදි. මෙයින් ගම්‍ය වනුයේ මගධ උපභාෂාවක් වූ පැරණි මාගධී භාෂාව ව්‍යවහාර කරමින් ධර්ම ප්‍රචාරයේ නිරත වන්නට ඇති බවයි. පාලි අට්ඨකථා සම්ප්‍රදායෙහි බුදුරදුන් මාගධී භාෂාවෙන් දේශන පැවැත් වූ බව සනාථ කරයි.[2] එහෙත්, වර්තමානයේ පාලි භාෂාව යනුවෙන් අප හඳුනාගන්නා මාගධී භාෂාව පිළිබඳ විවිධ මතවාද පවතී. මේ පිළිබඳ කරුණු දක්වන විවිධ උගතුන් අශෝක අභිලේඛන ඇසුරෙන් උදාහරණ ගෙනහැර දක්වමින් මාගධී භාෂාවෙහි ලක්‍ෂණ පෙන්වා දෙයි.

එසේ ම ප්‍රථමා විභක්ති ඒකවචන රූප 'එ' අන්තව යෙදීම වැනි ප්‍රාකෘත ලක්‍ෂණ පැරණි ගාථා දේශනා තුළ සුරැකිව පැවැතීම ද බුදුන් විසින් දේශිත භාෂාව අවස්ථානුකූලව විවිධ වෙනස්කම්වලට පත් වී ඇති බවට නිදසුනකි.[3]

අට්ඨකථා, ටීකා විවරණවල දී 'අත්ථං පාති රක්ඛතීති පාළි' යන නිර්වචනය අනුව අර්ථය ආරක්ෂා කරන්නේ 'පාලි' නම් බව දක්වයි. 'පාළි වියාති පාළි' යන්නෙන් ඇතුළත පිහිටි ජලය රකින අර්ථයෙන් මහා තඩාගයක බැම්ම වැනි යැයි ද, 'පකට්ඨානං වචනප්පබන්ධානං ආළීති පාළි' යන්නෙන් ඉතා උසස් සීලාදි අර්ථයන් යථාවබෝධ කරන බැවින් ද බුදුන් විසින් දෙසූ දේශනා මාධ්‍යය පාලි නම් බැව් අර්ථ දක්වයි. මෙකී පාලි භාෂාව සියලු භාෂාවන්ට ආධිපත්‍යය වූ හෙයින් මූලභාෂාව යැයි ද මගධයෙහි උපන් බැවින් හෝ බුදුන් වහන්සේ විසින් දේශිත භාෂාව වූ බැවින් මාගධී නම් වන බවත් ආදි කල්පික මිනිස්සු ද, බ්‍රහ්මයෝ ද අශ්‍රැතවත් පුද්ගලයෝ ද මාගධිය ම කථා කරන බවත් පූර්වාචාර්යයන් විසින් ප්‍රකාශ කර ඇති අයුරු අට්ඨකථාචාරීන් පෙන්වා දෙයි.

'සා මාගධී මූලභාසා නරා යා යාදිකප්පිකා

බ්‍රාහ්මානො චස්සුතාලාපා සම්බුද්ධා චාපි භාසරෙ'

ඒ කෙසේ වුවත් ක්‍රි. පූ. 03 වෙනි සියවසේ මහින්දාගමනයෙන් පසු මෙරට පාලි භාෂා භාවිතය ආරම්භ වන්නට විය. එනම් මිහිඳු හිමියන් සමග මෙරටට රැගෙන ආ පෙළ දහම සහ අට්ඨකථා සාහිත්‍යය පදනම් කර ගෙනය. එහෙත් උන්වහන්සේ විසින් පෙළ දහම ලිඛිත සාහිත්‍යයක් වශයෙන් හෝ වාචනා මාර්ගයෙන් රැගෙන එන ලද්දේ දැයි නිශ්චිතව කිව නොහැකි බැව් විද්වතුන්ගේ පෙන්වාදීමයි.[4] මෙසේ මගධ බසින් රැගෙන ආ අට්ඨකථා සහිත පෙළ දහම දීපවාසීන්ගේ ප්‍රයෝජනය සඳහා නැවත හෙළ බසට නඟන ලද බැව් සඟි අටුවා මූලාරම්භයේ දීම සඳහන් කෙරේ.[5] ක්‍රි. ව. 05 වෙනි සියවසේ බුද්ධඝෝෂාචාරීන් විසින් පාලි අට්ඨකථා රචනයට මූලාශ්‍රය කර ගනුයේ මෙම හෙළටුවා සමූහයයි. මෙම ඓතිහාසික සාහිත්‍යමය

ප්‍රවෘත්තීන්ට අනුව ක්‍රි. පූ. 06 වෙනි සියවසේ සිටම පාලි භාෂා භාවිතය ලිඛිත හෝ වාචික වශයෙන් යම් පමණක භාවිතයක පැවැති බවට විශ්වාස කළ හැකිය. එසේ ම බුදුදහම ඉන්දියාවේ පහළ වුවත් කාලයත් සමඟ එය විවිධ භාෂා හා උපභාෂා කථා කරන තදාසන්න ප්‍රදේශ කරා ව්‍යාප්ත විය. එසේ ව්‍යාප්ත වීමත් සමඟ ඒ ඒ ප්‍රදේශවල භාවිත උපභාෂාවන්ගේ සම්මිශ්‍රණයෙන් ද බුද්ධ දේශනාව සඳහා වෙනම උපභාෂාවක් භාවිත වන්නට ඇත.

ශාසන සංවර්ධනයත් සමග ශාස්ත්‍ර සංවර්ධනයෙහි නියුක්ත වූ ලාංකික පැරණි බෞද්ධ ආචාර්‍යීහු පාලි භාෂාව අභාවිත භාෂාවක් බවට පත් නොකොට ග්‍රන්ථ නිර්මාණයෙහිත් කථා සංලාපයෙහිත් නිරතව ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවක් ද දායාද කළහ. ක්‍රි. පූ. 06 වෙනි සියවසේ පටන් මෙරට ලේඛනයේ ආරම්භය සිදු වී තිබූ බව දීපවංස, මහාවංස ආදි ඓතිහාසික සාහිත්‍යමය සාධකයන්ට අනුව විශ්වාස කෙරේ. විජය රජු මෙරටට පැමිණ ජනාවාස පිහිටුවීමේ පුරාවෘත්තීන්ට අනුව ස්වකීය අභිෂේකය ලක්දිව දී සිදුකිරීම සඳහා මධුරාපුර පඬි රජුගේ දියණිය කැඳවාගෙන එන ලෙස පඬි රජුට ලේඛනයක් යවනු ලැබේ.[6] එයට ප්‍රතිචාර වශයෙන් සිය දියණිය වූ භද්දකච්චායනා කුමරිය ලේඛනයක් සමග විජය කුමරු වෙත එවනු ලැබේ.[7] ක්‍රි.පූ. 04 වෙනි සියවසේ අභය රජු පණ්ඩුකාභය කුමරුට රහස්‍ය ලිපියක් යවනු ලැබේ.[8] මෙම සෑම අවස්ථාවක දී ම 'ලේඛං' යනුවෙන් දක්වන්නට වූයේ ලේඛනයයි, ලියවිල්ලයි හෙවත් හසුන්පතයි. මෙම ලිපි ගණුදෙනුව සිදුකළ ද්‍රව්‍ය පිළිබඳ නිශ්චිතව කිව නොහැකි වුව ද පුස්කොළ ස්වභාවයෙන් යුක්ත ලේඛන විශේෂයක් බැව් සිතිය හැකිය. ක්‍රි.පූ. 03 වෙනි සියවසේ මහින්දාගමනයෙන් පසු මෙරට ලේඛනය වඩා ස්ථාපිත විය. එනම් මිහිඳු හිමියන් සමග මෙරටට රැගෙන ආ පෙළ දහම සහ අට්ඨකථා සාහිත්‍යය පදනම් කර ගෙනය. පෙළ දහම ලිඛිත සාහිත්‍යයක් වශයෙන් හෝ වාචනා මාර්ගයෙන් රැගෙන එන ලද්දේ දැයි නිශ්චිතව කිව නොහැකි බැව් විද්වතුන්ගේ පෙන්වාදීමයි.[9] මෙසේ මගධ බසින් රැගෙන ආ අට්ඨකථා සහිත පෙළ දහම දීපවාසීන්ගේ ප්‍රයෝජනය සඳහා නැවත හෙළ බසට නඟන ලද බැව් ත්‍රිපිටක අට්ඨකථා මූලාරම්භයේ දීම සඳහන් කෙරේ.

'අත්ථප්පකාසනත්ථං අට්ඨකථා ආදිතො වසීසතෙහි,

පඤ්චහි යා සංගීතා අනුසංගීතා ච පඤ්චහි.

සීහලදීපං පන ආභතාථ වසීනා මහාමහින්දත්ථෙරෙන,

ඨපිතා සීහල භාසං දීපවාසීනමත්ථාය.

අපනෙත්වාන තතොහං සීහලභාසං මනොරමං භාසං,

තන්තියානුච්ඡවිකං ආරොපෙන්තො විගත දොසං.'[10]

ක්‍රි.ව. 05 වෙනි සියවසේ බුද්ධඝෝෂාචාරීන් විසින් පාලි අට්ඨකථා රචනයට මූලාශ්‍රය කර ගනුයේ මෙම හෙළටුවා සමූහයයි. මෙම ඓතිහාසික සාහිත්‍යමය ප්‍රවෘත්තීන්ට අනුව ක්‍රි.පූ. 06 වෙනි සියවසේ සිටම මෙරට ලේඛන කලාවක් පැවැති බවට සාධක හමුවේ. අනතුරුව ලේඛන කලාව ව්‍යාප්ත වනුයේ මහින්දාගමනයත් සමග ලක්දිව වැසියන් බුදුදහම වැළඳ ගැනීමේ පටන්ය. එසමයේ සිට ගල්ලෙන්, වන සෙනසුන් වාසස්ථාන වශයෙන් සකස්කර පිදූ බව සඳහන් කරමින් ලියවුණු සෙල්ලිපි හමුවීමෙන් ඒ බැව් වඩාත් පැහැදිලිය. ශිලා ලේඛන හැරුණු කොට ද්‍රව්‍යමය ලේඛන වර්ගයක් ද හුවමාරු වී ඇති බව මුලින් දැක්වූ ප්‍රවෘත්තීන්ගෙන් ද හෙළිවේ. බෙහෙවින් ඒවා පුස්කොළ ම වියහැකි බැව් පිළිගත හැකි අතර කාලයාගේ ඇවෑමෙන් ඒවා විනාශයට පත්වන්නට ඇත.

උත්තිය කුමරු කැලණියේ විසූ රජුගේ බිසවට භික්ෂුවකගේ වෙස්ගත් පුද්ගලයෙකු අතේ රහස් ලිපියක් යැවූ බැව් සඳහන් වේ. දුටුගැමුණු කුමරු රුහුණේ සිට සිදුකළ ලිපි ගණුදෙනු පිළිබඳ ද[11] වට්ඨගාමිණී අභය රජු කුපික්කල (කුත්ථික්කල) විහාරයේ වැඩ සිට මහාතිස්ස තෙරුන්ට වැටකෙයියා (කෙතකී) පතක ලියා අභයගිරි විහාරය පවරා දෙන බව පවසමින් යැවූ පුවතක් පිළිබඳව ද මහාවංසයේ සඳහන් වේ.[12] මෙම ඉතිහාසමය ප්‍රවෘත්තීන්ට අමතරව ඉතා වැදගත් ම සිදුවීම වනුයේ වට්ඨගාමිණී අභය නිරිඳුන්ගේ රාජ්‍ය සමයේ අටුවා සහිත තෙවළා බුදුදහම පොත්වල ලියවීමයි.[13] එහි 'පොත්ථකෙසු ලිඛාපයුං' යනුවෙන් අර්ථවත් වූයේ පුස්කොළ හෙවත් තල්පත් විශේෂයකම ලියා තැබූ බවයි. එසේම

රජතුමාට තල්පත් මණ්ඩපයක් ඒ සඳහා සිදුකර දෙන ලෙස ද භික්ෂූන් ඇරයුම් කළ බව ද සඳහන් වේ.[14]

මෙසේ හෙළබසින් තිබූ අටුවා පෙළට පරිවර්තනය කළ හෙයින් එනම් ක්‍රි.ව. 03 වන සියවසේ සිට ක්‍රි.ව. 05 වන සියවස දක්වා කාලය තුළ තල්පත්වල ලේඛනය සිදු වූ බවට කංඛාවිතරණී අටුවා පාඨයකින් ද සනාථ වේ. පාතිමොක්ඛයෙහි 'මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය' යන පාඨයට විවරණ සපයමින් 'වාචාය වා තාලපණ්ණාදීසු ලිඛිත්වා පකාසෙය්‍ය' (යමෙක් වචනයෙන් හෝ තලපත් ලිවීමෙන් හෝ මරණයෙහි ගුණ වර්ණනා කරන්නේ ද) යනුවෙන් තල්පත් භාවිතයෙහි ප්‍රධාන සාධකයක් හමුවේ. මේ අනුව පුස්කොළ ලේඛනය අටුවා සහිත ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ අවදියේ සිට පැවැත එන්නක් බව මෙයින් වඩාත් තහවුරු වේ. එසේම අට්ඨකථාචාරීහු වාචික සහ ලේඛන මාධ්‍යය දෙකම ස්වකීය අට්ඨකථාවන්හි ඉදිරිපත් කර ඇති ආකාරයෙන් ද එකල පැවැති ලේඛන ශෛලිය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිය. වාචික යන්න 'ඉති පඨන්ති, ඉති සජ්ඣායන්ති' යනුවෙනුත් ලේඛන යන්න 'ඉති ලිඛන්ති, ඉති පොත්ථකෙසු ලිඛන්ති' යනුවෙනුත් භාෂාවේ යෙදේ.

බුද්ධඝෝෂ හිමියන් තල්පත්වල ලේඛනය සිදුකළ ආකාරය පිළිබඳ බුද්ධඝෝසුප්පත්තියේ දී ද දීර්ඝ විවරණයක් ඉදිරිපත් කෙරේ. දිනක් බුද්ධඝෝෂාචාරීන් පිඬු පිණිස වඩින අතරතුරේ දී තල්පත් කපන මිනිසෙකුගෙන් වැටුනු තල් පතක් රැගෙන ගිය බවත්[15] මෙය දුටු තල්පත් කපන්නා වෙනත් දිනෙක බොහෝ තල්පත් ප්‍රමාණයක් බුද්ධඝෝෂ හිමියන්ට ලැබෙන අයුරින් විසුරුවා තැබූ බවත් සඳහන් වේ.[16]

දුටුගැමුණු රජුට මරණ මංචකයේ දී 'පුඤ්ඤපොත්ථක' හෙවත් පින්පොතක් කියවීමට සැලැස් වූ බව මහාවංශයේ සඳහන් වේ.[17] එසේ ම 13 වෙනි සියවසේ ලියූ පූජාවලියේ දුටුගැමුණු රජු විහාරස්ථානවලට දුන් දානවස්තූන් අතර බණ පොතක් ද වූ බැව් සඳහන් වේ.[18] මේවා පොත්ථක (පොත්) නමින් ම හැඳින්වෙන බැවින් පුස්කොළ පොත් බවම විශ්වාස කළ හැකිය.

ක්‍රි.පූ. 03 වෙනි සියවසේ හෙළටුවා රචනා කිරීමත් ක්‍රි.පූ. 01 වෙනි සියවසේ වට්ටගාමිණී අභය රජ දවස ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමත් ක්‍රි.ව. 05 වෙනි සියවසේ බුද්ධඝෝෂාචාරීන් විසින් පාලි අට්ඨකථා රචනා කිරීමත් යන ප්‍රධාන අවස්ථා තුන ලාංකේය පුස්කොළ ලේඛන ඉතිහාසයේ ප්‍රධානතම සන්ධිස්ථානයෝ වෙති. බුද්ධඝෝෂාචාරීන්ගේ සිට නූතනයේ මහනුවර අවදිය දක්වා පුස්කොළ ලේඛනය විවිධ අවදීන් පසුකරමින් පැවත ගෙන එනු ලැබේ.

එහෙත් මුල් අවදියේ සිට සුරක්ෂිතව පැවැත ගෙන ආ පාලි භාෂාව හා සාහිත්‍ය පසුකාලීනව රටේ ඇති වූ අභ්‍යන්තර ආරවුල්, විදේශීය ආක්‍රමණ සහ ඇතැම් රජවරුන්ගේ විනාශකාරි ක්‍රියා මෙන් ම භික්ෂූන් අතර ඇති වූ නිකාය භේදමය මත ගැටුම් වැනි සිද්ධීන් මුල් කරගනිමින් ඇතැම් අවස්ථාවන්හි පරිහානියට පත් වන්නට විය. ක්‍රි. ව. 1505 සිට මෙරට ඇති වූ පෘතුගීසි, ලන්දේසී සහ ඉංග්‍රීසි විදේශීය ආක්‍රමණ හේතුවෙන් මහනුවර අවදිය තෙක් විශාල ශාස්ත්‍රීය පරිහානියක් ඇතිවිය. ක්‍රි. ව. 1815 දී ඉංග්‍රීසීන් උඩරට රාජ්‍ය අල්ලා ගැනීමත් සමග මල්වත්ත අස්ගිරිය උභය විහාරයන්ට අයත් පුස්තකාලවල තිබූ විශාල පුස්කොළ පොත් ප්‍රමාණයක් පැහැර ගන්නා ලදි. ඒ බැව් රඹුක්කන සෝභිත නම් තෙරුන් ස්වකීය පුස්කොළ පිටපතක සඳහන් කරනුයේ මෙසේය.

'රඹුක්කන සෝභිත උන්නාන්සේ වන මම මෙම පොත් සඟවා ගෙන හන්තානේ කැලය මැදින් සුරක්ෂිත ස්ථානයකට ගියේ..... ඉංග්‍රීසීන් විසින් මහනුවර ආක්‍රමණය කොට මල්වත්ත විහාරයේ උපෝසථාගාරය කඩා පොත් රෙදි හා අනෙක් දේ ගෝනි ගණන් ගෙනයන විට, ශ්‍රී බුද්ධවර්ෂ 2345 නවම් (1803 පෙබරවාරි) මාසෙහි දී ය.'[19]

නැවත ශාස්ත්‍රීය ප්‍රබෝධයක් ඇති වනුයේ ක්‍රි. ව. 17 වන සියවසේ වැලිවිට සරණංකර සංඝරාජයන්ගේ ශාසනික සහ අධ්‍යාපනික පුනරුදයේ ප්‍රතිඵලයක් වශයෙනි. සරණංකර සංඝරාජයන්ගේ ශාස්ත්‍රීය උන්නතියෙන් නැති වී ගිය පාලි භාෂාව නැවත ශාස්ත්‍රීය ප්‍රබෝධයක් සඳහා භාවිත කිරීම ඇරඹුණි.

ලාංකේය පිරිවෙන් අධ්‍යාපන ක්‍රමයේ මුල් අවස්ථාවන්හි ඒකායන පරමාර්ථය වූයේ සකු මගධ බස උගත් පිරිපුන් සිල්වත් ගුණවත් නැණවත් භික්ෂුවක් නිර්මාණය කිරීමයි. මෙම අපේක්ෂාව ඇතිව විද්‍යෝදය, විද්‍යාලංකාරය වැනි පිරිවෙන් බිහිවන්නට විය. මුල් අවධීන්හි මෙම ආයතන මගින් අපේක්ෂිත මූලික අරමුණ ඒ අයුරින් ම සාධනය කර ගැනීමට හැකි වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් තෙවළා බුදු දහම පිළිබඳ මනා ප්‍රාගුණ්‍යත්වයකින් හෙබි තෙරවරු දෙස් විදෙස් රටවල ධර්ම ප්‍රචාරයෙහි නිරත වූහ.

වර්තමානයේ අප විසින් ඉගෙන ගන්නා භාෂා බොහෝය. බෞද්ධ භික්ෂූන් වශයෙන් එයින් ප්‍රබලත්වයෙහි හා ප්‍රමුඛත්වයෙහි තබා ගත යුතු භාෂාව නම් බුද්ධ භාෂා සංඛ්‍යාත මාගධියයි. යම් භාෂාවක් ඉගෙන ගැනීමේ සාඵල්‍යය නම් එම භාෂාවෙන් ලිවීම හා කථා කිරීම නිවැරදිව සිදු කිරීමට හැකි වීමයි. දැනට අප ඉගෙන ගන්නා පාලි භාෂාවෙන් එසේ නිවැරදිව ව්‍යක්තව කථා කිරීමට හැකි වේද? යන්න අප විසින් ම විමසිය යුතු කරුණකි. අපගේ පූර්වාචාර්යවරු පාලිය පිළිබඳ ලේඛනයෙහිත් භාෂණයෙහිත් ප්‍රාගුණ්‍යත්වයක් දැක් වූ නිසාම පාලි භාෂාව සම්බන්ධව විශාල සාහිත්‍යයක් අපට හිමිවිය.

වර්තමානයේ ලංකාවේ වෙසෙන තිස් දහසක් පමණ භික්ෂූන් වහන්සේලා පාලි භාෂාව කථා කරත් නම් කෙතරම් වටී ද? වර්තමානයේ භික්ෂූන් වහන්සේලා ඉංග්‍රීසි භාෂාව වරද්දමින් හෝ කථා කිරීමට උත්සාහ දරතත් දෙවියන් සහිත පණ්ඩිත ජනයා විසින් පරිභාවිත පරිසේවිත පාලි භාෂාවෙන් කථා කිරීමට අල්ප වශයෙන් වත් කිසිදු වීර්යයක් නොකරති. පිරිවෙනේ දීත් විශ්වවිද්‍යාලයේ දීත් තමන් පාලි භාෂාව ඉගෙන ගන්නා නමුත් එම භාෂාවෙන් කථා කිරීමට උත්සුක වන්නේ අතළොස්සකි. අප ඉගෙන ගන්නා භාෂාවකින් කථා කිරීම වරදක් යැයි කිසිවෙකුට කිව නොහැකිය. ඉන්දු ආර්ය භාෂා ගණයට නෑකම් කියන සිංහල භාෂාව සම්බන්ධයෙන් උද්දීපනය වන්නට නම් පාලි, සංස්කෘත මාතෘ භාෂාවන්ගේ සංවර්ධනයම කළ යුතුය.

එදා සිට අද දක්වා ම භික්ෂූන් වහන්සේලාගේ නාමකරණයේ දී භාවිත වූයේ පාලි නාමයන් ම පමණි. සිංහලයෙන් හෝ

සංස්කෘතයෙන් ලාංකේය භික්ෂූන්ට නම් තැබීමක් දැකගත නොහැකිය. දරුවෙක් පැවිදි වීමේ දී ස්වකීය ජන්මයෙන් ලැබෙන ගිහි නාමය සම්පූර්ණයෙන් ම ඉවත් කර ඒ වෙනුවට පැවිදි වන අවස්ථාවේ දී ම පාලි නාමයක් ලබා ගනී. ඒ අයුරින් තමාගේ මුල් නම අතහැර අභිනව නමක් ලබාගන්නා එකම කණ්ඩායම පැවිදි පාර්ශ්වයයි. ඒ නම ද පාලි නාමයක් වීම ද විශේෂත්වයකි.

පාලි භාෂාව දීර්ඝ කාලයක් තිස්සේ කථා නොකරන භාෂාවක් වශයෙන් සමාජගත වී ඇත. අප අතර ඇති බොහෝ නවීන තාක්ෂණික මෙවලම්වලට පාලි නාමයක් ලබා දී නොමැත. මෙසේ පාලිය තුළ කිසිදු උද්දීප්තියක් නොමැති නිසා ම මළ බස යැයි හඳුන්වන්නට ඇතැම්හු පෙළඹෙති. මෙය පාලි භාෂා ශාස්ත්‍රයට බලපා ඇති විශාල අර්බුදයකි. ලාංකිකයන් වන අප කුසීත බවින් ප්‍රමාද වුවත් ප්‍රතිචීන භාෂා කෙරෙහි උනන්දු වන විදේශිකයෝ පාලිය ඉගෙන එය ලිවීමටත් කථා කිරීමටත් බෙහෙවින් ඇලුම් කරති. අද ජාත්‍යන්තර භාෂාව වශයෙන් ඉංග්‍රීසි ව්‍යාප්තව පැවැතියත් එය ලතින් හා ප්‍රංශ භාෂාවලින් වචන ණයට ගෙන සකස් කරගත් වෙළඳ භාෂාවකි. මේ පිළිබඳ මනා විචාරයක් පැළෑනේ වජිරඤාණ හිමියන් විසින් 'පාළි ඉගෙනීම' මැයෙන් ඉදිරිපත් කර ඇති ලිපියෙහි කරුණු ගොනු කර ඇත.[20] එවැනි භාෂාවක් අද අප මූල භාෂාවක් බවට පත්කරගෙන අපගේ මූල භාෂාව අප විසින් ම මළ භාෂා ගණයට දමා ඇත. මේ නිසාම පාලි භාෂාවෙන් සුකර ලෙස කථා කරන්නට සමත් භික්ෂුවක් හෝ ශක්තිවන්තයෙක් සොයා ගැනීම සුකර නොවේ. එනිසා වර්තමාන අධ්‍යාපන ක්‍රමයේ ඇති දුර්වලතා මඟහරවා භික්ෂූන් විසින් හෝ නැවත පෙළ බසින් කථා කරන්නට පරිචයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය කාරණයකි.

පාලියට ජීවී බවක් ලබා දීමට නම් එය කථා කරන භාෂාවක් බවට පත්කර ගත යුතුමය. මේ සඳහා ලංකාවේ සියලුම පිරිවෙන්වල පාලි භාෂාවෙන් කථා කරන්නට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. එසේම අපගේ සියලුම විශ්වවිද්‍යාලවල බෞද්ධ හා පාලි අධ්‍යයන අංශ මේ සඳහා විශේෂ අවධානයක් යොමු කොට පාලි භාෂා විද්‍යාර්ථීන් එකතු කොට පාලි භාෂා

සංසද පිහිටුවා පාලි භාෂාවට පුනර්ජීවයක් ලබා දිය යුතු කාලය එළඹ ඇත.

**පාලි භාෂා අධ්‍යයනය**

අතීතයේ සිට වර්තමානය දක්වා ම පාලිය ඉගෙනීම ලක්දිව පන්සල් අධ්‍යාපන ක්‍රමය තුළ ප්‍රධාන කාරණයක් විය. පසුව මෙය බටහිර රටවල උගතුන් විසින් ද ඉතා උසස් ඉගෙනීමක් සේ ගෙන අධ්‍යයනය කරන ලදි. බටහිර උගතුන් අතර පාලිය වඩා ජනප්‍රිය භාෂාවක් බවට පත්වන්නේ එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම (Pali Text Society - PTS) පිහිටුවීමත් පෙළ, අට්ඨකථා සහ වෙනත් ප්‍රකරණ ග්‍රන්ථ රෝමන් අකුරෙන් මුද්‍රණය කිරීමත් සමගය. අද වන විට සියලු ම ත්‍රිපිටක සහ ඒවායෙහි පරිවර්තන සිදුකොට අවසන්ය. එසේ ම ලෝකයේ සියලු ම විද්‍යාර්ථීන්ට උපයෝගී කරගත හැකි පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂ කීපයක් ම සම්පාදනය කර තිබේ. රීස් ඩේවිඩ්ස්ගේ පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂය, චයිල්ඩර්ස්ගේ පාලි භාෂාව ශබ්දකෝෂය, ත්‍රෙන්ක්නර්ගේ විචාරාත්මක පාලි ශබ්දකෝෂය, මාග්‍රට් කෝර්න්ගේ පාලි ශබ්දකෝෂය මෑත ඉතිහාසයේ පාලි භාෂාව වෙනුවෙන් සම්පාදනය වූ විශිෂ්ටතම ශබ්දකෝෂ වෙයි. මේ සියලුම කෘති සම්පාදනය වනුයේ ද බටහිර උගතුන් විසිනි. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, විදුරුපොල පියතිස්ස හිමි, ගුණපාල වීරසේකර යන අය විසින් ඉංග්‍රීසි පාලි ශබ්දකෝෂ රචනා කළත් ඒවා පාලි භාෂාවේ දේශ දේශාන්තර ව්‍යාප්තිය සඳහා උපකාරි වූයේ නැත. පාලි පොත් සමාගම මගින් සිදු කරගෙන යන ශාස්ත්‍රීය සේවය පාලි භාෂාව හා බුද්ධ ධර්මය අධ්‍යයනය කිරීම ප්‍රවර්ධනය කිරීමේ ප්‍රශස්ත සත්කාර්යයකි. අපේ ඇතැම් පිරිස් විසින් පාලි භාෂාව මළ භාෂාවක් යැයි අවතක්සේරු කිරීමට දිය හැකි කදිම පිළිතුර නම් විදේශීය බටහිර උගතුන් පාලි භාෂාව සම්බන්ධයෙන් සිදුකරගෙන යන ශාස්ත්‍රීය සේවයයි.

ජපන්, ඉන්දියා, තායිලන්ත, මියන්මාර්, කාම්බෝජ, මැලේසියා වැනි ආසියා රටවලත්, එංගලන්තය, ජර්මනිය, ඇමෙරිකාව වැනි බටහිර රටවලත් බොහෝ විශ්වවිද්‍යාලවල පිළිගත් විෂයක් වශයෙන් මේ වන විටත් පාලි භාෂාව ඉගැන්වීම

සිදුකර යනු ලැබේ. එසේ ම ඇතැම් විශ්වවිද්‍යාලවල උපාධි විෂයක් වශයෙන් ද මුල සිට ආචාර්ය උපාධිය හැදෑරීම දක්වා පාලි භාෂාව උසස් තත්වයකට පත්කොට ඇත. ලෝකයේ පාලි උගතුන් මෙසේ වැඩි වී ඇත්තේ පාලිය හැදෑරීම ත්‍රිපිටකය මැනවින් අධ්‍යයනයට බෙහෙවින් උපකාරි වන බව තේරුම් ගැනීමත් සමගය.

නොයෙක් සමයාන්තර ඥාන දර්ශනයන්හි ප්‍රවීණත්වයකින් හෙබි විද්‍යාර්ථීන්ට බෞද්ධ දර්ශනය පිළිබඳ පෘථුල අවබෝධයක් ලබා ගැනීමට පාලි භාෂා ඥානය අත්‍යවශ්‍යය. ඇතැමුන් විසින් බෞද්ධ විචාර කෘති පමණක් විමසා බෞද්ධ දර්ශනය පිළිබඳ විචාරශීලී දැනුමකට අවකාශ නොකියන්නේ පාලි භාෂාව පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති නිසාය.

බාල, තරුණ, මහලු යන ජීවිතයේ කිනම් වයසක සිටින ස්ත්‍රියක හෝ පුරුෂයෙකු කුල්මත් කොට අනුචිත අයුරින් නොමඟ යවන කාමෝද්දීපනය ඇති කරන කිසිදු ලේඛනයක් පාලියෙහි නොමැත. පාලි කෘති වනාහි දැනුම හා ශික්ෂණය පාදක කරගනිමින් පමණක් පරිශීලනය කළ යුතු ග්‍රන්ථ සමුදායක් ම වෙයි.

පාලි භාෂාව ඉගෙනීමෙන් ප්‍රතිචීනයන්ට වඩා ප්‍රාචීන වූ සිංහල අපට ලැබිය හැකි ප්‍රයෝජන රාශියක්ම වෙයි. බටහිර උගතුන් පාලිය හැදෑරීමට උනන්දුවක් දැක්වුවත් ඊටත් වඩා සෑම අංශයකින්ම සම්බන්ධ වූ සිංහල අප අද වන විට පාලි භාෂාව කෙරෙහි විශේෂ සැලකිල්ලක් තබා ඒ පිළිබඳ හැඟීමක් වත් නැති තරම්ය. සිංහල ගිහි පිරිස් අතර පාලිය දන්නා පිරිස් සිටින්නේ නම් ඒ ඉතා අතලොස්සක්ම පමණි. එයිනිදු බොහෝ පිරිසක් පිරිවෙන් අධ්‍යාපනය ලැබූ පිරිසක් හෝ උපැවිදි වූ පිරිසක්ම වෙයි. ඒ නිසාම පාලි උගත් පඬිවරුන් ඇත්තේ ඉතා අතළොස්සක් පමණි. භික්ෂූන් වහන්සේලා අතර නම් තවමත් පාලි ඉගෙනීම දැකිය හැකිය. ඒ පිරිවෙන් අධ්‍යාපනය හදාරන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ විශ්වවිද්‍යාලවල පාලි විෂය උපාධිය සඳහා හදාරනු ලබන පිරිස වෙයි. මෙසේ පැවිදි සමාජය තුළ පාලි ඉගෙනීම ව්‍යාප්තව පැවැතියත් ඒ සියල්ලන් තුළ ම පාලිය පිළිබඳ විශාරද වූ ප්‍රාමාණික දැනුමක් ඇත්දැයි විමසිය යුත්තෙකි.

පැරණි ලාංකික පඬිවරුන් පාලිය පිළිබඳ ප්‍රාගුණ්‍යත්වයකින් යුක්ත වූවෝ වුවත් වර්තමානයේ නම් එබඳු ස්වභාවයකින් යුක්ත පාණ්ඩිත්‍යයකින් හෙබි උගතුන් සොයා ගැනීමත් උගහටය. මහනුවර අවධිය වන තෙක්ම පාලිය කෙරෙහි දක්ෂ උගතුන් පැවිදි පක්ෂයෙන් පමණක් නොව, ස්ත්‍රී සහ පුරුෂ දෙපක්ෂයෙනුත් නියෝජනය කෙරෙනු බව කරුණු විමසීමෙන් දැකිය හැකිය. 'එළු මගධ සකු බස - යුතු පොත් කියත මෙදිගැස' වැනි යෙදුම්වලින් පාලි පිළිබඳ මනා ප්‍රවීණත්වයකින් යුත් කාන්තාවන් ද සිටි බව පැහැදිලි වේ. පිළිමතලව්වේ නිළමේ, කොබ්බෑකඩුවේ නිළමේ වැනි රදළයන් පවා පාලිය කෙරෙහි දක්ෂ ගිහි උගතුන් බව ඔවුන් සතුව පාලි ත්‍රිපිටක පොත් රාශියක් සුරක්ෂිතව පවත්වාගෙන ඒම තුළින් පැහැදිලි වේ. බොහෝ පාලි ත්‍රිපිටක පුස්කොළ පොත් ප්‍රමාණයක ලේඛන හිමිකාරිත්වය හිමිවනුයේ ද පුරුෂ පක්ෂයට වීමෙන් ඔවුන් සතු පාලි දැනුම විශද කෙරේ. එහෙත් අද පාලියට දුර්භග දශාවක් එළඹෙන්නට ඇත්තේ ස්වජාතික දේ ඇගැයීමකට පත් නොකොට අපට උරුම වූ ඉගෙනීමේ ක්‍රමවේද පසෙකලා අන්‍ය ජාතික බලපෑම් මත විජාතික අධ්‍යාපන ශිල්ප ක්‍රම අප රට තුළ ස්ථාපිත වීමත් සමගය. සියරට දේ දෝෂ දර්ශනයටත් පිටරට දේ පරිහරණයට ගැනීමත් හේතුවෙන් පාලියත් පාලියෙන් ලියවී තිබුණු ත්‍රිපිටක ධර්මයත් දිනෙන් දින මිනිසුන් අතරෙන් ඈත් වන්නට විය. පැරණි ඉගෙනීමේ ක්‍රමවේද පෝෂණය කිරීම වෙනුවට ඒවා ක්‍රමයෙන් ශෝෂණයට පත්වෙන අයුරින් ක්‍රියා කිරීමට වීම නිසා ලාංකේය සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමවේදයත් දුරස්ථ වන්නට විය.

පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යටත් පාලන සමයේ මෙරට අපට ආවේණික සංස්කෘතිය, සදාචාරය, අධ්‍යාපනය අහිමි වන්නට විය. එහෙත් ඉංග්‍රීසින්ගෙන් අප නිදහස් වීමත් සමග නැවතත් අප සතු පාරම්පරික දේ ස්ථාපිත කිරීමට අවකාශ ලැබුණි. දැන් අපට අපේ දේවල් ගැන සිතා බැලීමට නිරවුල් නිදහසක් ලැබී ඇත. බටහිර බලවේගයන්ගෙන් නිදහස් වූ අපට නැවත පැරණි සාම්ප්‍රදායික දේ ස්ථාපිත කිරීමට අවකාශ උදා වී ඇත. අතීතයේ පාලි මෙරට ප්‍රධාන ඉගෙනීමේ විෂයක් වී නම් නැවතත් පාලි

ඉගෙනීම අප සමාජය තුළ දියුණු කිරීමට කටයුතු කිරීම උචිතම කාලය එළඹ ඇත.

සිංහල ජාතියට ස්වකීය අනන්‍යතාවක් හිමි වනුයේ පාලියෙන් ලියවුනු ත්‍රිපිටකය, අට්ඨකථා සහ මහාවංස, චූලවංස, ථූපවංස වැනි ඉතිහාස ග්‍රන්ථ සාහිත්‍යය නිසාය. අපගේ ජාතියේ ඉතිහාසයත් ජාතික ආගමත් ලියවී තිබෙන්නේ අද පසෙකට දමා තිබෙන පාලි භාෂාවෙන් ය. පාලි භාෂාවෙන් තොර ජාතියත්, ආගමක් ගැන කථා කිරීමට කිසිදු අවකාශයක් නොමැත. එදිනෙදා පෙහෙවස් සමාදන් වන උවසු උවසියන් සිල් සමාදන්වීම් ආදියෙහි පටන් භික්ෂූන් කෙරෙහි පැවැත්වෙන සාංඝික දානමය කටයුතු දක්වා සියල්ල සිදු වනුයේ පාලියෙන් කියනු ලබන වාක්‍යය, ගාථා අනුසාරයෙනි. ඒ තමන්ගේ ශාස්තෘවරයාගේ දේශනා මාධ්‍යය පාලිය වූ නිසාමය. ලෝකයේ අනිකුත් සියලුම ආගම් පාහේ කාලයෙන් කාලයට වෙනස්කම්වලට බඳුන් වී ප්‍රතිසංස්කරණ ඇති වී තමන්ගේ මුල් ශාස්තෘවරයාගෙන් දුරස්ථ වූ භාෂාවකින් පැවැතගෙන එනු ලබයි. එහෙත් පාලි භාෂාව බුදුන් වහන්සේගේ දේශනා මාධ්‍යය වූ තැන් සිට අද දක්වා ම අවිච්ඡින්නව පැවැත එන එකම ආගමික භාෂාව වෙයි. මේ නිසා බුදුදහම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට පාලි භාෂාව පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය. බෞද්ධ හෝ අබෞද්ධ ඕනෑම අයෙකුට බුදුදහම පිළිබඳ විචාරයට, තර්කයට, වාදයට එළඹීමට පෙර පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට පාලි භාෂාව ඉගෙනීම කළ යුතුය.

වර්තමාන ලෝකයේ ම උගතුන් පාලිය පිළිබඳ විවිධ අධ්‍යයන සිදුකළත් පාලි භාෂාව සුරක්ෂිතව රැකගෙන ඒමේ ගෞරවය හිමිවන්නේ සිංහලයන් වන අපටය. අපගේ පුරාතනයන් විසින් ගණනකට නොගෙන පාලි භාෂාව සුරැකිව පවත්වා ගෙන ආවේ නැත්තම් අද මුළු ලෝකයෙන් ම පාලි භාෂාව අතුරුදහන් වී ඇත. බැමිණිතියාසාය අවස්ථාවේ දී දිවි දෙවෙනි කොට ආරක්ෂා කළේ පාලිය සහිත පෙළ දහමයි. මේ අයුරින් පාලි භාෂාව ආරක්ෂා කළේත් සංවර්ධනය කළේත් අන් රටවලට ව්‍යාප්ත කළේත් පැරණි සිංහලයන් විසින් මය. මෙය නොදත් අයෙක් වේ නම් එය සිංහලයන් වන අපට මහත් අභාග්‍යයකි.

වර්තමානයේ පාලි භාෂාව ඉගෙනීමට බොහෝ පහසුකම් සුලභව ඇත. සෑම පිරිවෙනක ම පාලි භාෂාව පළමු වසරේ සිට අවසාන පන්තිය දක්වා උගන්වයි. ප්‍රාචීන අධ්‍යාපනයේ දී ද පාලිය ප්‍රධාන විෂයක් වේ. බුදුදහමත් පාලි භාෂාවත් මූලික කරගනිමින් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයත් බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයත් ආරම්භ කර ඇත. එසේ ම පල්ලෙකැලේ ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලයත් මානෙල්වත්ත නාගානන්ද බෞද්ධ විශ්වවිද්‍යාලයත් පාලි භාෂාව සහ බුදුදහම ප්‍රවර්ධනය කිරීම සඳහා අප සතු ප්‍රධාන උසස් අධ්‍යාපන ආයතන දෙකකි. එසේ ම ජාතික විශ්වවිද්‍යාල වන පේරාදෙණිය, කැලණිය, ජයවර්ධනපුර, කොළඹ, රුහුණ වැනි අනිකුත් විශ්වවිද්‍යාල තුළත් පාලි භාෂාව උපාධි විෂයක් වශයෙන් හැදෑරීමටත් අවස්ථාව උදා වී ඇත. ප්‍රධාන විශ්වවිද්‍යාල අනුබද්ධිත බෞද්ධ හා පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන බිහිවීම තුළින් පාලි විෂය පශ්චාත් උපාධි දක්වා ප්‍රවර්ධනය කිරීමට සමත් වී ඇත. එහෙත් ගැටලුව වනුයේ පහසුකම් කෙතෙක් තිබුණත් ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් පාලි භාෂා අධ්‍යයනයට යොමු වන්නේ ද යන්නයි.

එංගලන්තයේ පාලි පොත් සමාගම මගින් ත්‍රිපිටකය සංස්කරණය කිරීම, ශබ්දකෝෂ සම්පාදනය කිරීම, අටුවා, ව්‍යාකරණ, සාහිත්‍ය ග්‍රන්ථ සංස්කරණය කිරීම, වාර්ෂික සඟරා නිකුත් කිරීම, ත්‍රිපිටක පරිවර්තන සිදුකිරීම වැනි විශාල සාහිත්‍ය සේවයක් සිදුවීම තුළින් බටහිර වියතුන්ට පාලි ඉගෙනීමට බෙහෙවින් උපකාර වේ. ලංකාවේ හේවාවිතාරණ සංස්කරණවලින් අනතුරුව බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ සංස්කරණ ඇති කිරීම පාලි ඉගෙනීමට බෙහෙවින් උපකාර වී ඇත. විද්වත් සංස්කාරක මණ්ඩලයක් විසින් බුද්ධ ජයන්ති සංස්කරණ සිදු වී ඇති අතර ඒවා සිංහල පාලි භාෂාද්වයෙන් ම ඉදිරිපත් කිරීම විද්‍යාර්ථීන්ට නිවැරදිව පෙළ තේරුම් ගැනීමට හැකියාව ලැබේ.

## බුද්ධ ජයන්ති ත්‍රිපිටක සංස්කරණය

විද්වත් ග්‍රන්ථ සංස්කාරක මණ්ඩලයක් විසින් සම්පාදිත බුද්ධ ජයන්ති ත්‍රිපිටක සංස්කරණ ග්‍රන්ථ මාලා දැනට අප අතර

තිබෙන විශිෂ්ටතම ත්‍රිපිටක සංස්කරණ මාලාව බව සඳහන් කළ යුතුය. එක් පිටුවක පාලි පෙළත් අනිත් පිටුවෙහි සිංහල පෙළත් දක්වා තිබීම බුද්ධවචනය ඉගෙනීමේ දී පරිවර්තන අවශ්‍ය නම් ඒ අඩුවත් සපුරා තිබීම ඉතා වැදගත්ය. පෙළ සංස්කරණයේ දී ලක්දිව විවිධ ස්ථානවල සුරක්ෂිතව පැවැති පුස්කොළ ඇසුරින් සහ බුරුම, සියම්, ඉංග්‍රීසි සහ කාම්බෝජ සංස්කරණවලින් හමුවන විකල්ප පාඨ දැක්වීම ද පාලි පෙළට සමගාමීව මහායාන ත්‍රිපිටකයෙන් යම් පාඨයක් හමුවේ නම් එය ඇතුළත් කිරීම ද ශාස්ත්‍රීය සංස්කරණයක දැකිය හැකි විශේෂ ලක්‍ෂණයකි. ඒ වන විටත් සංස්කරණය කර තිබුණු හේවාවිතාරණ සංස්කරණවලින් හමුවන පාඨාන්තර දෝෂ ද ශුද්ධ කොට බුද්ධ ජයන්ති සංස්කරණය සිදු කොට ඇත. බුද්ධ ජයන්ති සිංහල පරිවර්තනය ද සාමාන්‍ය පරිවර්තනයක් පමණක් නොවේ. පාලි පිටුවේ ඇති පාඨ ඒ අයුරින් ම සිංහල පිටුවේ දැක්වීම සුගම කටයුත්තක් නොවේ. එසේම ඇතැම් පාලි පාඨ සිංහලට පරිවර්තනය කිරීමේ දී පාලි පෙළටත් වඩා තේරුම් ගැනීමට අපහසු ආකාරයක් ඇතැමෙකුට දැකිය හැකිය. එවැනි අවස්ථා මතුවනුයේ අට්ඨකථා ඇසුරින් ශුද්ධ සිංහලයෙන් පරිවර්තනය සිදුකර ඇති නිසාවෙනි. එසේ ම ඇතැම් පාලි වචනවලට අර්ථ ඉදිරිපත් කිරීමේ දී අටුවා විග්‍රහයන් කෙරෙහි ද අවධානය යොමු කරන්නට වී ඇති බව පරිවර්තන දෙස බැලීමෙන් වැටහෙන කරුණකි. එබැවින් යමෙකුට බුද්ධවචනය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාදීමට සිංහලයෙන් රචිත විශිෂ්ට ම ත්‍රිපිටක සංස්කරණය බුද්ධ ජයන්ති සංස්කරණයයි. දැනට අප සතුව පවතින විශ්වාසනීය හා පිළිගත හැකි එකම සංස්කරණය ද මෙය වෙයි.

වර්තමානයේ බුද්ධ ජයන්තිය හැරුණු කොට වෙනත් සංස්කරණයක් අප සතු නොවේ. එහෙත් විවිධ පුද්ගලයන් විසින් සිදුකර ඇති සිංහල පරිවර්තන කීපයක් ම දැකිය හැකිය. එහෙත් ඒවා පිරික්සීමේ දී විවිධ පාඨාන්තර දෝෂ හා පරිවර්තන දෝෂ සහිතව සිදුකර ඇති බව පෙනේ. ඇතැම් පරිවර්තන සරල සිංහල පරිවර්තන ස්වරූපයෙන් ඉදිරිපත් කර ඇත. බුදුන් විසින් දේශිත පෙළ දහමෙහි සරල බවක් අප විසින් කිසිදු අයුරකින් සිදු

කළ නොහැකිය. බුද්ධ වචනයේ අර්ථ සරල කොට සූත්‍රයන්හි අන්තර්ගතය වෙනස් කොට ගම්භීර ධර්ම කරුණු සියුම් කොට ඉදිරිපත් කිරීම යනු නියම අර්ථයට සිදුකරන මහත් හානියකි. සූත්‍රයක් පිළිබඳ සරල හා සංක්ෂිප්ත අනුවාදයක් සැපයිය හැකිය. එහෙත් සූත්‍රයක අර්ථය පරිවර්තන ස්වරූපයෙන් සරල කළ නොහැකිය. සොයිසා මුද්‍රණයේ පරිවර්තන ද සම්පූර්ණ නොවන නමුත් ග්‍රන්ථ දුලභ කාලයේ එතුමා ත්‍රිපිටකය සුරක්ෂිත කිරීමට ගත් වෑයම ප්‍රශස්තය. මේ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් දූෂිත පාඨ නිරවද්‍ය කරමින්, විකල්ප රූප අන්ත සටහන්වල යොදමින්, පරිවර්තනයේ දී ව්‍යාකූල තැන් අටුවා අනුසාරයෙන් විශද කරමින් සිදු කර ඇති බුද්ධ ජයන්ති සංස්කරණය දැනට අප සතුව ඇති වැදගත් ම ත්‍රිපිටක සංස්කරණය වෙයි.

බුද්ධ ජයන්ති සංස්කරණ සිංහල උගත් විද්‍යාර්ථීන්ට පමණක් අධ්‍යයන කිරීමට සිදුවීම විශාල පාඩුවකි. එය විදේශීය විද්වතුන්ගේ ද අධ්‍යයනට යොමු වීමට නම් බුද්ධ ජයන්ති සංස්කරණ රෝමන් අක්ෂරගත කිරීම සිදුවිය යුතුය. එහෙත් මෙතෙක් ඒ සඳහා විද්වතුන්ගේ අවධානය යොමු වී ඇති බවක් නොපෙනේ. එබැවින් සියලු ම බුද්ධ ජයන්ති සංස්කරණ රෝමන් අක්ෂරවලට පෙරළීම ඉංග්‍රීසි කියවිය හැකි සියලුම දෙනාගේ ප්‍රයෝජනය සඳහා හේතු වනු නිසැකය.

එහෙත් බුද්ධ ජයන්ති සංස්කරණයේ ද ශුද්ධ කළ යුතු තැන් බොහෝය. ඒ සඳහා දැන් කාලය එළඹ ඇතැයි හැඟේ. එය පහසු කාර්යයක් ද නොවනු ඇත. බුද්ධ ජයන්ති සංස්කරණයේ දී බොහෝ විට බුරුම ඡට්ඨසංගීති සංස්කරණ පාඨ ඒ අයුරින් ම යෙදී ඇති ආකාරයක් දැකිය හැකිය. එබඳු තැන්වල දී අපට ආවේණික පාඨ බුද්ධ ජයන්තියෙන් ගිලිහී ඇත. එයට ප්‍රධාන හේතුව වන්නට ඇත්තේ ඡට්ඨසංගීතිය සඳහා සහභාගි වූ තෙරවරුන් විසින් ම 1956 ලංකාවට පැමිණ බුද්ධ ජයන්ති සංස්කරණ කාර්යය සිදුකිරීම යැයි සිතිය හැකිය. ලක්දිව සුරක්ෂිතව පැවැතෙන නිකාය පුස්කොළ පොත් ඇසුරු කොට ඇත්තේ ද ඉතා අවම වශයෙනි. නිසැකයෙන් ම අසුරු කළ යුතු පැරණි නිකාය පුස්කොළ පිටපත් දැන් හමුවෙමින් පවතී. එබැවින් ඒ සියලුම නිකාය පිටපත් එකතු

කොට නැවත අභිනව ත්‍රිපිටක සංස්කරණයක් සිදුකිරීමට කාලය එළඹ ඇතැයි අපගේ අදහසයි.

**පාලි ත්‍රිපිටක පරිවර්තන කාර්යය**

එක් භාෂාවකින් තවත් භාෂාවකට පරිවර්තනය කිරීම සඳහා පරිවර්තකයා විසින් සැපිරිය යුතු පියවර කීපයක් ම වෙයි. විශේෂයෙන් ග්‍රන්ථයේ අර්ථය වටහා ගැනීම හා එම අවබෝධය අන් භාෂාවට නැඟීම එහි දී ප්‍රධානතම කරුණුයි. ග්‍රන්ථය වටහා ගැනීම යනු ග්‍රන්ථයේ වචනවල තේරුම පමණක් නොව එම ග්‍රන්ථය හා සම්බන්ධ ඓතිහාසික පසුතලයෙහි ඇති පෙර සම්ප්‍රදායවලින් පැවැත එන දේවල් හා නොපැවතෙන දේවල් පිළිබඳ වටහාගැනීම මූලික කරුණක් වේ. අවිශේෂඥයන්ට තේරුම්ගත හැකි පරිදි එසේම මුල් භාෂාවේ සෑම සියුම් අර්ථයක් ම පැහැදිලි වන පරිදි මුල් ශ්‍රාවකයන් විසින් එය කියවා හෝ අසා ලැබූ වැටහීම හා වින්දනය එම පරිවර්තනය කියවන්නාට ද ලැබෙන පරිදි පරිවර්තනය කිරීමයි.

පරිවර්තන කාර්යයේ දී ග්‍රන්ථය වටහා ගැනීමටම මුල් ග්‍රන්ථයේ භාෂාව පිළිබඳ විශාරදත්වයක් ලබා තිබිය යුතුය. පරිවර්තකයාගේ බලාපොරොත්තුව මුල් කෘතිය එහි මුල් පාඨකයාට දුන් කරුණු සියල්ල ම ඒ ආකාරයෙන් ම වත්මන් පාඨකයාට ද දීම වුවත් එම කාර්යය අංග සම්පූර්ණව කිරීමට අපහසු නිසා පරිවර්තකයා ඊළඟට උත්සාහ කළ යුත්තේ ඔහුගේ සීමාවන් ඉඩදෙන උපරිම ආකාරයෙන් එය කිරීමට ක්‍රියාකිරීමයි. පසු පරම්පරාවකට ඊට පෙර පරම්පරාවේ ග්‍රන්ථයක අන්තර්ගතය සම්පූර්ණයෙන් වටහා ගැනීම දුෂ්කරය. එයට හේතුව එම ග්‍රන්ථය ලියූ ඓතිහාසික හා සාමාජික පසුබිම සුලු වශයෙන් හෝ දෙවන පරම්පරාවෙන් වෙනස් බැවිනි. ග්‍රන්ථයේ මුල් පාඨකයින්ගේ පරිසරය නැවත සොයා ගන්නට උත්සාහ නොකරන්නේ නම් සෑම පරම්පරාවක් ම ග්‍රන්ථයක් වටහා ගන්නේ එම පරම්පරාවේ ම සාමාජික හා ඓතිහාසික පසුබිමේ සිට බව පෙනේ. පෙර හා පසු ආගන්තුක පරම්පරාවකට අයත් ග්‍රන්ථයක් වටහා ගැනීමට උත්සාහ ගන්නා විට සංස්කෘතික පරතරයක් අතර ඇති පරතරය

එම පරිවර්තන කාර්යයට දුෂ්කරතා එකතු කරයි. බුදුරජුන් හෝ බුද්ධශ්‍රාවකයෙකු විසින් දේශිත පාලි සූත්‍රයක් සිංහලයට පරිවර්තනයක් කිරීම ගතහොත් අපගේ ප්‍රථම අරමුණ විය යුත්තේ එම සූත්‍රය එදා පැවතුණ ඓතිහාසික හා සාමාජික පසුබිම තුළ එය ශ්‍රවණය කළ නැතහොත් බුදුරජුන්ගේ සමකාලීනයන්ට එය දුන් අර්ථය ලබා ගැනීමයි. ඉන් පසුව එම අර්ථය අද සිංහල පාඨකයාට ලබාදිය හැකිය. මෙහිදී සෑම මුල් ත්‍රිපිටකාගත සූත්‍රයක් ම යම් ආකාරයක පරිවර්තනයක් බව බොහෝ අවිශේෂඥයන් විසින් වටහා නොගත්තකි. මෙම මූලික කරුණු පිළිබඳ කිසිදු අවබෝධයක් නොමැතිව වර්තමානයේ විවිධ පුද්ගලයන් විසින් විවිධාකරයෙන් ත්‍රිපිටක පරිවර්තන සිදුකරන ආකාරයක් දැකිය හැකිය. පරිවර්තනයක දී ප්‍රධාන වශයෙන් උපකාරි වනුයේ ඔහු සතු භාෂා දැනුමයි.

තමන් පරිවර්තනය කිරීමට බලාපොරොත්තු වන ග්‍රන්ථයේ මුල් ස්වරූපය ස්ථාපිත කිරීම පිණිස වාග්විද්‍යාත්මක හා සාහිත්‍ය විචාරය සම්බන්ධ සියලු ම මූලාශ්‍රය භාවිත කළ යුතුය. ඒ සඳහා බුදුන් දවස හා බුදුන් පිරිනිවනින් පසු මුල් සියවස්වල උතුරු ඉන්දියාවේ හා ලංකාවේ භාවිත වූ භාෂා පිළිබඳ දැනීමක් අවශ්‍යය. ඒ භාෂා දැනුම ලබාගැනීම සඳහා පාලි භාෂාව අයත් වන මධ්‍ය ඉන්දු ආර්ය භාෂා පිළිබඳවත් එසේ ම සම්භාව්‍ය හා බෞද්ධ මිශ්‍ර සංස්කෘත පිළිබඳවත් විශේෂඥතාවක් අවශ්‍යයි. මුල බෞද්ධ ග්‍රන්ථවල වැඩි ප්‍රමාණයක් සංස්කෘත භාෂාවෙන් ගෙන හෝ සංස්කෘත භාෂාවට සම්බන්ධතාවක් හෝ ඇත. බොහෝ පාලි ත්‍රිපිටක ග්‍රන්ථවලට සමාන කෘති බෞද්ධ මිශ්‍ර සංස්කෘතයෙන් පවතී. පාලි ත්‍රිපිටක ග්‍රන්ථ අද දක්වා පැමිණ ඇත්තේ පරම්පරා හා සම්ප්‍රදාය ගණනාවක් ඔස්සේ භාණක සම්ප්‍රදායන් මගින් බැවින් නිවැරදි ග්‍රන්ථයක් සකස් කරගෙන පරිවර්තනය කිරීම සඳහා පරිවර්තකයා විසින් මේ පරම්පරා හා සම්ප්‍රදාය සියල්ල ම සලකා බැලීම අවශ්‍යය. ඇතැම් කාලවල ස්වාධීනව පැවැති ග්‍රන්ථ තවත් කාලවල වෙනත් සම්ප්‍රදායන් සමග ද එක්වීමෙන් අවුල් සහගත ලෙස සම්මිශ්‍ර වී ඇත. අංගුත්තර භාණකයන් විසින් පවත්වාගෙන එන ලද අංගුත්තර නිකායේ එසේ සදොස් තැන්

කීපයක් හමුවෙනු ඇත. එසේ ම බුරුමයෙන් කාම්බෝජයෙන් ලංකාවෙන් ලාඕසයෙන් හා තායිලන්තයෙන් අද අප අතට පත්ව ඇති අත්පිටපත් හා මුද්‍රිත සංස්කරණ යම් ප්‍රමාණයකට එම රටවල පරම්පරා හා සම්ප්‍රදායය මත පදනම්ව ඇත. මේ නිසා එම අත්පිටපත් හා මුද්‍රිත සංස්කරණ එක්තරා අංශවලින් එකිනෙකට වෙනස්විය හැකිය. එංගලන්තයේ පාලි පොත් සමාගම මගින් මුද්‍රණය කර ඇති සංස්කරණ වඩාත් වැදගත් වන්නේ මේ විවිධ සම්ප්‍රදායවල අත්පිටපත් හා සංස්කරණ සියල්ල පදනම්ව ඒවා සකස් කර ඇති හෙයිනි. සම්ප්‍රදාය සියල්ල ම සැලකීම දුෂ්කර නිසා තම පරිවර්තනය එක් සම්ප්‍රදායකට පමණක් සීමා කරගත හැකි වුවත් එහිදීත් විසඳාගත යුතු තවත් ප්‍රශ්න ඇත. එකම සූත්‍රය ත්‍රිපිටකය තුළ දෙතුන් පළක හමුවිය හැකි අතර ඒවා සංසන්දනය කරනා විට එකිනෙකට එකඟ නොවන බව වැටහෙනු ඇත.

තම ග්‍රන්ථය එක සම්ප්‍රදායකට සීමා කරගෙන අටුවාවල හා සමාන්තර ග්‍රන්ථවල ඇති දේ මැදිහත් නොකරගෙන පරිවර්තනය කිරීමට තීරණය කළත් එම සම්ප්‍රදායේ කවර සංස්කරණයක් පරිවර්තනය කරන්නේ ද එම තෝරාගත් සංස්කරණයේ පාදක සටහන්හි ඇති පාඨ භේදයන්ගේ බලපෑමකට කොයි ආකාරයකින් හෝ යටත් වන්නේ ද යන ප්‍රශ්නවලට මුහුණ දීමට පරිවර්තකයාට සිදුවේ.

පාලි තේරුම අන් භාෂාවකට නැගීමේ දී සැලකිය යුතු ප්‍රශ්න කීපයක් ම විසඳා ගත යුතු වේ. එනම් පරිවර්තනය අදාළ භාෂාවේ සාමාන්‍ය පාඨකයාට කියවා තේරුම් ගත හැකිද? යන්න මුලින් ම සැලකිය යුත්තකි. මේ නිසා බෞද්ධ පාඨ ඉංග්‍රීසියට නැගීම බොහෝ ඉංග්‍රීසි පරිවර්තනවලින් ගත හැකි ප්‍රයෝජන අඩුවීම එක් නිදසුනකි. එසේ ම සිංහල බුද්ධජයන්ති පරිවර්තන බෞද්ධ පාඨ සහිත ශුද්ධ සිංහලයකින් පරිවර්තනය කර ඇති නිසා ප්‍රයෝජන අඩු වීම ද ප්‍රධාන හේතුවකි. මෙහි දී විමසිය යුතු තවත් පැනයක් නම් මිශ්‍ර භාෂාවකට නගන්නේ ඇයි ද යන්නයි. සෑම පාලි පදයකට ම අන් භාෂාවේ වචන සොයා පරිවර්තනය කිරීමට ක්‍රියා කිරීම නිසාත් සෑම පාලි පදයකට ම ඍජුව ගැලපෙන වචන එම භාෂාවේ නොමැති වීම නිසාත් ඇතැම් වචන ව්‍යවහාරයෙන්

ඇත් වී තිබීම නිසාත් මිශ්‍ර භාෂාවකට පරිවර්තනය කරන්නට ඇත.

එක් පාලි වචනයක් එය යෙදී ඇති සෑම තැනම අදාළ භාෂාවේ එකම වචනයකින් පරිවර්තනය කළ යුතුද? සෑම පාලි වචනයක් සඳහා ම අදාළ භාෂාවෙන් ගැලපෙන වචනයක් සොයා යෙදිය යුතුද? සෑම පාලි වචනයකට ම ගැලපෙන වචන අදාළ භාෂාවෙන් සොයාගත හැකිද? පාලි භාෂාව සමානාර්ථ වචන අතින් ධනවත් නිසා පාලියේ විවිධ සමානාර්ථ වචන සඳහා ඉංග්‍රීසි වචන සොයා ගැනීම අපහසුය. කාව්‍යමය හා පැරණි ඉංග්‍රීසි වචන යෙදීමෙන් මුල්පාලියේ නැති තේරුම් පාඨකයාට ලැබීමට ඉඩ ඇති වේ. පාලි වචනවලට සුදුසු නැති වචන නොමැති නිසා යම් යම් වචන පරිවර්තනය නොකර යෙදීම නිවැරදි ද? එක් පරිවර්තනයෙක 'පීති' යන වචනයට දී ඇති (zest, exuberance, or ecstasy) යන වචන දැක එම වචනය පීති ලෙසම යෙදීය. මෙලෙස පරිවර්තනය නොකර පාලි වචන යෙදීම අනුමත කළ නොහැක. පරිවර්තනය නිතරම අවිශේෂඥයන්ට තේරුම්ගත හැකි විය යුතුය. පරිවර්තනය නොකළ වචන තේරුම් ගත හැක්කේ මුල් ග්‍රන්ථයේ භාෂාවේ දන්නා කෙනෙකුට හෙවත් විශේෂඥයාට පමණි. එය එසේ නම් පරිවර්තනයක් කිරීමේ තේරුම කුමක් ද? එලෙස පරිවර්තනය නොකර යෙදීම නිසා බොහෝ විට පරිවර්තනය පාඨකයාට තේරුම් ගැනීම අපහසු කරයි.

පාලි සූත්‍රයක් වෙනත් බසකට පරිවර්තනය කිරීමේ දී අර්ථය නිවැරදිව පරිවර්තනය වී ඇත්දැයි යන්න අවිනිශ්චිතමය. පාලි පරිවර්තනයේ දී භාෂා දැනුම මෙන් ම සම්ප්‍රදාය පිළිබඳව ද මනාව හඳුනාගෙන තිබීම අත්‍යවශ්‍යය. පාලියෙහි 'දිට්ඨි' යනු දැක්ම යන අර්ථයි, එහෙත් 'දිට්ඨිඤ්ච අනුපගම්ම' යන්නෙහි අර්ථය 'මිථ්‍යාදෘෂ්ටි නොවී' යන අර්ථයි. සතර අගතියේ දී ඡන්ද යනු ආශාව, ලෝභය, අකුසලයට කැමැත්ත ආදී අගතිගාමී අර්ථ සඳහා යෙදේ. එහෙත් අභිධර්මයේ දී ඡන්ද යනු අඤ්ඤසමාන චෛතසිකයකි. එබැවින් එය කුසල අකුසල දෙපක්ෂයම දියුණු කරගැනීමට සිතේ ඇතිවන ආචාර ධර්මීය තත්වයකි. එසේ ම 'ධම්මචක්ක' යන තැන ධම්ම යනුත් 'ජාතිධම්ම' යන තැන 'ධම්ම' යනුත් යෙදෙනුයේ එකම අර්ථයෙන් ධර්මය යනුවෙන් නොව ඒ ඒ

අවස්ථාවට අනුව අර්ථ ගැන්වෙන බව පැහැදිලිය. ඒ අනුව පාලියේ සෑම පදයකට ම පදානුපදික පරිවර්තන ලබාදීමෙන් පමණක් මුල් පෙළට සාධාරණයක් සිදුකිරීමට නොහැකි බව ප්‍රත්‍යක්‍ෂය. පාලියට පදානුපදික පරිවර්තන දීම නිසා අර්ථ විලෝපනය සිංහල පරිවර්තනවලින් පමණක් නොව ඉංග්‍රීසි පරිවර්තන රාශියකින් ම එම දෝෂය සිදු වී ඇත. ඒ පදය ගැන පමණක් සලකා සම්ප්‍රදාය ගැන අවබෝධයක් නොමැතිකම නිසාය.

අද බොහෝ දෙනා ත්‍රිපිටකය වශයෙන් පරිශීලනය කරනු ලබන විවිධ මුද්‍රණ පිළිබඳ විවිධ ගැටලු මතුවෙමින් පවතී. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් මුද්‍රණය කර ඇත්තේ බුද්ධ ජයන්තියේ ම පුනර් මුද්‍රණ වශයෙන් ග්‍රන්ථ මාලාවකි. එහෙත් මහමෙවුනා අසපුව විසින් මුද්‍රණය වනුයේ ශාස්ත්‍රීය පදනමකින් තොරව සම්පාදනය කර ඇති සරල සිංහල ත්‍රිපිටකයකි. එම පරිවර්තන ත්‍රිපිටකයට කළ සිංහල අනුවාද මිස සම්පූර්ණ විචාරාත්මක ත්‍රිපිටක පරිවර්තන වශයෙන් සැලකිය නොහැකිය. මහමෙව්නාවේ බෝධිඥාන ත්‍රිපිටක පරිවර්තන මාලාව පෙළට සිදුකළ හුදෙක් තවත් එක් පරිවර්තනයක් වශයෙන් පමණක් සැලකීම යුක්ති සහගතය. එහෙත් එහි පරිවර්තන කාර්යය විමසීමෙන් සරල සිංහල පරිවර්තනයකට සහ කාව්‍යාත්මක ස්වරූපයකට සමීපව සිදුකර තිබීම මුල් පෙල පරිශීලනයට මහත් හානියක් වනු නිසැකය.

නිදර්ශනයක් ලෙස සත්තිස්බෝධිපාක්‍ෂික ධර්ම විවරණය කළ හැක්කේ පාලියෙන් ම පමණි. ඒවා අන්‍ය භාෂාවකින් පරිවර්තනය කළේ නමුත් නිවැරදි අර්ථය කිසිදු අයුරකින් දිය නොහැකිය. අටුවාවේ දී එම පද විවරණය කිරීම සිදුකළා මිස මුල් පද පරිවර්තනයක් සිදුකර නොමැත. එබැවින් ඉංග්‍රීසියෙන් හෝ සිංහලයෙන් අපට නියම අර්ථය ගෙන දෙන අයුරින් ඒවා පරිවර්තනය කළ නොහැකිය. පාලිය නම් විශ්ව සාධාරණ භාෂාවකි. ලෝභය හැඳින්වීමට පාලියේ එම පදයම මිස වෙනත් පද ගණනාවක් භාවිත කළත් නියම පාලි අර්ථය ගෙන දීමට නොහැකිය. එවැනි පද වෙනත් භාෂාවකට පරිවර්තනය කිරීමෙන් සිදුවනුයේ මුල් භාෂාවෙන් කියවුණු පදයෙන් ලබාදුන් අර්ථය තවත්

ව්‍යාකූලත්වයට පත්වීම පමණි. අර්ථ ධර්ම නිරුක්ති පටිභාන යන සිවු පිළිසිඹියා පිළිබඳ අර්ථ ධර්ම විවරණත් නිරුක්තියත් ලබා දිය යුත්තේ පාලියෙන් ම මිස වෙනත් භාෂාවකින් නොවේ. එනිසා පාලිය සිංහලට හෝ වෙනත් භාෂාවකට පාලියෙන් තොරව පරිවර්තනය කිරීම නිර්මල ධර්මය මහත් විනාශයට පත්වීමට මූලාධාරය වෙයි. එනිසාම තථාගතයන් වහන්සේ පාලිය වෙනත් භාෂාවකට පරිවර්තනය කිරීමට හෝ ඡන්දසට නැගීමට විරුද්ධ වූ අතර පාලිය පාලියෙන් ම ඉගෙනීම කළ යුතු බව අනුදැන වදාළහ.

මෙම පරිවර්තන ව්‍යාකූලත්වය නිසා වර්තමාන බෞද්ධ විශ්වවිද්‍යාල, බුද්ධශාසන අමාත්‍යංශය සහ බෞද්ධ නායකයින් විසින් සිදුකළ යුතුම කාර්යය වන්නේ ත්‍රිපිටක ධර්ම ග්‍රන්ථ පරිවර්තනය කිරීමේ දී එහි ගුණාත්මක භාවය තහවුරු කිරීම සඳහා අධිකාරි බලයක් සහිත කමිටුවක් පිහිටුවා පරිවර්තන කාර්යය සිදුකිරීමයි. එහි වගකීම පරිවර්තන විමර්ශනය කිරීම පමණක් නොව බුදුදහම සම්බන්ධයෙන් විවිධ කණ්ඩායම් විසින් පවත්වනු ලබන දේශන, අර්ථකථන, විචාර සම්බන්ධයෙන් ද නිවැරදි විමසීමක් කිරීම වැදගත් වෙයි. එසේ නොවන්නට නිර්ව්‍යාජ පෙළ දහම අනතුරකට පත්වීමට ඇති අවකාශ ඉතා දුර නොවේ.

## අභිනව ත්‍රිපිටක සංස්කරණයක අවශ්‍යතාව

වර්තමානයේ බෞද්ධ විද්‍යාර්ථීන් විසින් මුද්‍රිත පාලි ත්‍රිපිටක සංස්කරණ කීපයක් භාවිත කරනු ලැබේ. එයින් මූලික වශයෙන් එංගලන්තයේ පාලි පොත් සමාගම විසින් සිදුකළ ඉංග්‍රීසි සංස්කරණය, ලංකාවේ බුද්ධජයන්ති සංස්කරණය, බුරුමයේ ඡට්ඨසංගීති සංස්කරණය, තායිලන්තයේ සියම් සංස්කරණය ප්‍රධාන වෙයි. එහෙත් මෙම සංස්කරණ විමර්ශනාත්මක බැලීමේ දී හමුවෙන සාවද්‍ය දෝෂ බොහෝමයකි. එබැවින් නැවත අභිනව සංස්කරණයක අවශ්‍යතාව මතුව පවතී. ඉංග්‍රීසි සංස්කරණය විද්වත් උගතුන් රාශියකගේ එකමුතුවෙන් සංස්කරණය වී ඇතත් එහි බොහෝ පාඨ තීරණය කිරීමේ දී එක් සම්ප්‍රදායකට හෝ පුස්කොළ පිටපතකට සීමා වී ඇති බවක් දැකිය හැකිය. ඇතැම්

පුස්කොළ පාඨ නිවැරදිව හඳුනාගැනීමට නොහැකි සාවද්‍ය අයුරින් සූත්‍රවලට ඇතුළත් කළ අවස්ථා ද දැකිය හැකිය. කෙවට්ට සූත්‍රයට දී ඇති නම එයට උදාහරණයකි. ඉංග්‍රීසි සංස්කරණයෙහි 'කෙවද්ධ' යනුවෙනුත් බුරුම සංස්කරණයෙහි 'කෙවට්ට' යනුවෙනුත් සිංහල සංස්කරණයෙහි 'කෙවඩ්ඪ' යනුවෙනුත් විසදෘශතා ඇතිවන අයුරින් යොදා තිබේ. මෙසේ ව්‍යාකුල තැන් බොහෝමයක් මුද්‍රිත සංස්කරණයන්ගෙන් හමු වේ.

බුරුම සංස්කරණයේ දී සම්ප්‍රදායයට මුල්තැනක් දෙමින් බොහෝ පාලි පාඨ නිර්මාණය කර ඇති අයුරු දැකිය හැකිය. තම පාඨ නිවැරදි බව තහවුරු කිරීමට ඒවායේ ව්‍යාකරණ ලක්‍ෂණ විභාග කරමින් සද්දනීති නම් මහා ව්‍යාකරණය ද නිර්මාණය කරයි. සිංහල බුද්ධ ජයන්ති සංස්කරණය ද සර්ව සම්පූර්ණ නිවැරදි සංස්කරණයක් වශයෙන් සැලකිය නොහැකිය. බුරුමයේ ඡට්ඨසංගීතියේ ආභාසය බෙහෙවින් බුද්ධ ජයන්තියට ඇතුළු වී ඇති බව පැහැදිලිව පෙනේ. ලාංකේය පුස්කොළ පොත් සම්ප්‍රදාය විසින් සුරක්‍ෂිතව පවත්වාගෙන ආ ඇතැම් පාලි පාඨ හෝ ස්වකීය සංස්කරණයට ඇතුළු නොකළ අවස්ථා රාශියක් බුද්ධ ජයන්තියෙන් හමුවේ. සියම් සංස්කරණයත් කාම්බෝජ සංස්කරණයත් ඡට්ඨසංගීතිය ම බොහෝ දුරට අනුගමනය කරමින් සංස්කරණ කාර්යය සිදුකර ඇති බව දැකිය හැකිය. අද පවතින සංස්කරණයන්හි ඇති ව්‍යාකූලත්වය මෙසේ නිදසුනක් මගින් පෙන්වාදිය හැකිය.

බ්‍රහ්මජාල සූත්‍රයේ මුලින් ම දැක්වෙන 'භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා හොන්ති භික්ඛුසඞ්ඝඤ්ච හෝ විහරන්ති' යන යෙදීම පිළිබඳ සියලුම සංස්කරණයන්හි ඒකමතිකත්වයක් නොමැත. සිංහල, කාම්බෝජ සහ ලන්නා යන පුස්කොළ පොත්වලත් ඉංග්‍රීසි, කාම්බෝජ සහ සියම් සංස්කරණත් පළමු සහ දෙවෙනි ඡේද දෙකෙහිම උජුවිපච්චනිකවාදා වලින් පසුව 'භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබද්ධා හොන්ති භික්ඛුසඞ්ඝඤ්ච' යන වාක්‍යය ඇතුළත් වෙයි. එහෙත් බුරුම පුස්කොළ පොත්වලත් සංස්කරණයෙහිත් සිංහල බුද්ධජයන්ති සංස්කරණයෙහිත් දෙවෙනි ඡේදයෙහි නැවත ඉහත වාක්‍ය

ඇතුළත් නොවන අතර ඒ වෙනුවට උජුවිපච්චනිකවාදා වලින් පසුව ඇතුළත් වනුයේ 'විහරන්ති' යනුවෙන් පමණි. මෙයට අදාළ බ්‍රහ්මජාල සූත්‍ර පරිවර්තන විමසීමේ දී රීස් ඩේවිඩ්ස් සහ භික්ඛු බෝධි හිමියන්ගේ පරිවර්තන අනුගමනය කරනුයේ බුරුම සම්ප්‍රදායට අනුව විහරන්ති පදය පමණක් අදාළ කරගනිමිනි. මොරිෂ් වෝල්ස් පමණක් වෙනත් සම්ප්‍රදායක් අනුව පරිවර්තනය සිදුකොට ඇති බව දැකිය හැකිය. මෙසේ නිරාකූල කළ යුතු බොහෝ තැන් අද පවතින සංස්කරණයෙහි දැකිය හැකි වේ.

එහෙත් ලාංකික විද්වතුන්ගේ හෝ බලධාරීන්ගේ කිසිදු අවධානයක් නැවත සංස්කරණයක් ඇති කිරීම සඳහා මෙතෙක් යොමු වී නොමැත. නැවත සංස්කරණයක අවශ්‍යතාව අවබෝධ කරගත් තායිලන්තයේ ධම්මචායි අධ්‍යාපන ආයතනය ථෙරවාදි රටවල් සියල්ලෙහි ම පුස්කොළ පොත් ඒකරාශි කරගනිමින් සහ සියලු ම මුද්‍රිත සංස්කරණ ඇසුරු කරගනිමින් නැවත අභිනව ත්‍රිපිටක සංස්කරණ කාර්යයක නිරත වෙයි. එය භාරදූර දුෂ්කර කාර්යයකි. එහෙත් කළ යුතුම කටයුත්තෙකි. කෙසේ හෝ සියලු ම පුස්කොළ සම්ප්‍රදායයන් සහ සංස්කරණ ඇසුරු කරගනිමින් අභිනව ත්‍රිපිටක සංස්කරණයක් ඇතිකළ හොත් එය ලෝකයේ සියලු ම විද්‍යාර්ථීන්ට බෙහෙවින් උපකාරි වනු නිසැකය.

## ව්‍යාකූල අර්ථකථන ලබාදීම

පාලි පදවලට, ධර්ම සංකේතවලට වැරදි අර්ථකථන ලබාදීම තුළින් සිදු වී ඇත්තේ මහත් හානියකි. එබඳු සංකේත සහ පද කීපයක් පිළිබඳ විමසීම ඉතා වැදගත් වෙයි. පෙළෙහි විශාල පදමාලාවක් වැරදි ලෙස උද්ග්‍රහණය කරගැනීම තුළින් සිදුවී ඇති හානිය ද විශාලය. 'අනිච්ච' යන්නට 'අනිච්ඡ' යනුවෙන් වරදවා භාවිත කිරීම තුළින් මූලික අවබෝධයට මහත් හානියක් සිදුවීම එක් උදාහරණයකි. ත්‍රිලක්ෂණ සංකල්පයේ දී ගැනෙනුයේ අනිච්ච පදයයි. අනිච්ඡ යනු නොකැමැත්තයි. ත්‍රිලක්ෂණ අනිච්ච යන්නෙන් අර්ථවත් වූයේ නිත්‍ය නොවූ අනිත්‍යතාවයි. එය අනිච්ඡ ලෙස ගෙන කැමැත්තට විරුද්ධව පැවැත්ම යනුවෙන් ඇතැමෙක් අර්ථ දැක්වීම සාවද්‍යයි. ත්‍රිපිටකයේ අනිච්ච හා අනිච්ඡ පද යෙදෙනුයේ පැහැදිලිව වෙනස් අර්ථ දෙකක් ගෙනදීම සඳහාය.

එසේම 'අනත්ත' යන්නට 'අනත්ථ' යනුවෙන් වැරදි ලෙස භාවිත කිරීමත් එබඳුම සාවද්‍ය අවස්ථාවකි. ත්‍රිලක්ෂණයේ දීම ගැණෙන අනත්ත යනු ආත්ම තත්වයෙන් තොරබව හෙවත් අනාත්මවාදී ස්ථාවරත්වයයි. අනත්ථ යනු අනර්ථයයි. අනත්ත පදය අනත්ථ වශයෙන් වැරදි ලෙස ගැනීමෙන් අනර්ථය පිණිසම හේතුවන බව පෙනේ. ත්‍රිපිටකයේ අනිච්ච, අනිච්ඡ සහ අනත්ත, අනත්ථ පද යෙදී ඇති භාවිතය අනුව අර්ථ භේදය පැහැදිලි වේ. ඒ වචනවලින් එකම අර්ථ කියවෙන්නේ නම් පාලියේ ඒවා දෙපරිද්දකින් යෙදීමට අවශ්‍යතාවක් නොමැත. එබැවින් ත්‍රිලක්ෂණ සංකල්ප විවරණයේ යෙදෙන අනිච්ච හා අනත්ත පද අනිත්‍ය සහ අනාත්ම ලෙස සිංහලෙන් පරිවර්තනය කිරීම නිවැරදි පරිවර්තනය වන අතර එම අර්ථ අනිච්ඡ සහ අනත්ථ වලින් ලබාදීම අර්ථ ශූන්‍ය ක්‍රියාවක් බව පැහැදිලිය.

ඇතැම් පාලි පාඨ තෝරාගැනීමේ දී ආධුනිකයාට ව්‍යාකූලත්වයන්ට මුහුණ පෑමට සිදුවන අවස්ථා බොහෝය. බ්‍රහ්මජාල සූත්‍රයේ ඇතුළත් 'සඞ්ඛියධම්මො' හෝ 'සඞ්ඛියාධම්මො' යන පදය එබඳු අවස්ථාවකි. මෙම යෙදීම බ්‍රහ්මජාල සූත්‍රයට පමණක් විශේෂ වූවක් වන අතර වෙනත් සූත්‍රයන්හි යෙදීමකුදු දැකිය නොහැකිය. මේ සඳහා 'කථා, ධම්මීකථා' හෝ 'අන්තරාකථා' යනුවෙන් වෙනත් සූත්‍රයන්හි අර්ථ ලබාදෙයි. කෙසේ වුවද මෙය උභයාර්ථ වාචී පදයකි. මේ සඳහා කථා ස්වරූපය, කථා නම්‍යතාව, කථා අභිප්‍රාය, සංවාදය යන අර්ථ ශබ්දකෝෂයන්හි ලබාදෙයි. බුද්ධඝෝෂාචාරීන්ගේ සුමංගලවිලාසිනි අර්ථවිවරණයේ දී සඞ්ඛියා යනු කථා යන්නට සමාන වේ. (සඞ්ඛියා වුච්චති කථා, කථාධම්මොති අත්ථො). සඞ්ඛියා සහ කථා යන පද දෙකම ඉත්ථිලිංගයට අයත් වේ. එහෙත් මෙම අට්ඨකථා අර්ථවිග්‍රහයට අනුව වේද, සංස්කෘත හෝ ප්‍රාකෘත භාෂාවන්ගෙන් සඞ්ඛ්‍යා හෝ සඞ්ඛියා පද කථා යන්නට සමාන අර්ථයෙන් යෙදෙන ආකාරයක් දැකිය නොහැකිය. ඇතැම් අටුවා විවරණ වර්තමාන මූලාශ්‍රය සමග විමර්ශනය කිරීමේ දී නිශ්චිත නිගමනයකට එළඹීමට බොහෝ සෙයින් දුෂ්කර වේ. නිදර්ශන වශයෙන් සමන්තපාසාදිකා විනයට්ඨකථාවේ දැක් වූ 'ගන්ධ යනු හදය සඳහා සමාන වේ'

'විහිංසා යනු කුසගින්න සඳහා සමාන වේ' 'විඤ්ඤාණ යනු නිබ්බාණ සඳහා සමාන වේ' යනු එබඳු අර්ථ විවරණ ව්‍යාකූල අවස්ථා කිහිපයකි. මෙම විවරණ සීහළට්ඨකථා මත පදනම්ව අටුවාචාරීහු පාලියට පරිවර්තනය කළේ නම්, ඒවා නිවැරදි යැයි අප පිළිගැනීම තුළින් සඞ්ඛියා යනු ද කථා සඳහා සමානාර්ථ වන බැව් පිළිගත යුතු වේ. (සඞ්ඛියා වුච්චති කථා) සියලු සූත්‍ර පරිවර්තකයින් මෙය කථා යනාර්ථයෙන් පරිවර්තනය කරනුයේ ද අටුවා විවරණය මත පදනම්වය. ඉත්ථිලිංග ආකාරාන්ත පද සමාස පද අතරෙහි යෙදීමේ දී ද දීර්ඝ රූපයෙන් ම තබනු ලැබේ. නිද. සෙනාකථං, මාලාකථං, ලතාකම්මං, කථාපාභතං වශයෙනි. මෙම අර්ථයෙන් ගත්කල වුවද සඞ්ඛියාධම්ම යනුවෙන් දීර්ඝ රූපයෙන් සිටීම වඩා නිරවද්‍යය. 'සඞ්ඛා+ඉය > සඞ්ඛිය' යනුවෙන් සඞ්ඛියා පදය විභාග කළ හැකිය. සඞ්ඛ්‍යා පදය සංස්කෘතයේ දී බුද්ධිය, අවබෝධය හෝ ප්‍රඥාව වැනි අර්ථ ගෙනදෙයි. පාලි සූත්‍රවල සඞ්ඛා පදය ඥානාර්ථයෙන් යෙදී ඇත. 'සඞ්ඛා වුච්චති ඤාණං' පාලියෙහි සඞ්ඛ්‍යා පදයෙන් අර්ථ නියෝජනය වන අයුරු ශබ්දකෝෂ, පරිවර්තන කෘතීන්ගෙන් පැහැදිලි වේ. අට්ඨකථා විවරණ තුළ ද ඥානය, සංඛ්‍යානය, කොටස වැනි අර්ථ කිහිපයක් මෙම පදයෙන් ඉදිරිපත් කෙරේ. සාමාන්‍යයෙන් සඞ්ඛිය, සඞ්ඛා+ඉය යන්නෙන් 'ඥානයට අයත්' යන අර්ථ ලබාදෙයි. සඞ්ඛියධම්ම වශයෙන් හ්‍රස්ව රූපයෙන් තිබීමෙන් ද මෙම අර්ථයම ලබාදෙන බැව් පෙනේ. මෙම විග්‍රහයන්ට අනුව සඞ්ඛියධම්ම සහ සඞ්ඛියාධම්ම රූපද්වයම උචිතය, එහෙත් යෙදෙන අවස්ථාව අනුව වෙනස්විය හැකිය. සඞ්ඛියධම්ම වශයෙන් කෙටි රූපයෙන් සිටීම බුද්ධිමය සාධක (intellectual factor or phenomenon) මත පදනම්වත් සඞ්ඛියාධම්ම වශයෙන් දීර්ඝ රූපයෙන් සිටීම කථාව (ඒකන) මත පදනම්වත් යෙදීම වඩා උචිතය.

ධර්ම සංකල්ප, පද පිළිබඳ නිවැරදි අර්ථය ලබා දීමේ දී ඒවා යෙදෙන සන්දර්භය පිළිබඳ ව මූලික අවබෝධයක් පර්යේෂකයා සතු විය යුතුය. එසේ නොමැතිව හුදු වචනාර්ථය පමණක් ලබා දීමෙන් සිදුවන්නේ මූලික සංකල්පයන්ට මහත් හානියක් සිදුවීමකි.

## සිංහලෙන් පිරිත් කීම

පිරිත යනු 'පරිසමන්තතො තායති රක්ඛතීති පරිත්තං' යන විනයාලංකාරටීකාවට අනුව හාත්පසින්ම ආරක්ෂාව සපයන දේශනාවයි. පිරිත් දේශනා කිරීම බුදුරදුන් ධරමාන කාලයේ සිටම අද දක්වා ශාසන සම්ප්‍රදාය තුළ පැවැත එන චාරිත්‍ර ධර්මයකි. මිනිසුන්ට සෙත් ශාන්තිය උදාකර ගැනීම, නිරෝගි සුවය ලබාගැනීම, සුභ ඵල අපේක්ෂාව, මංගල අවස්ථා වැනි ජීවිතයේ විවිධ අවස්ථාවල දී පිරිත් දේශනා කරගැනීම දැකිය හැකිය. ලක්දිව තුළ චතුභාණවාර පාළි යනුවෙන් බණවර හතරකට බෙදා පිරිත් සූත්‍ර සංග්‍රහයක් සකස් කර ඇති අතර ඒ තුළ මිනිසාට යහපත උදාකරදීම සඳහා උපකාරි වන වැදගත් සූත්‍ර රාශියක් ඇතුළත් වෙයි. රතන, කරණීයමෙත්ත, ධම්මචක්කප්පවත්තන, සච්චවිභංග, බොජ්ඣංග, ආටානාටිය, මහාසමය යනු සූත්‍ර ධර්ම ගාම්භීරත්වයක් නොපෙනෙන අතර සත්‍යක්‍රියා වශයෙනුත් ධර්මාර්ථයට වඩා දේව නාමාවලියක් ඇතුළත් ධ්වනි පූර්ණ දීර්ඝ දේශනා වශයෙනුත් සඳහන් කළ හැකිය. මේ අනුව පිරිත යනු අර්ථය පමණක් අරමුණු කරගෙන ආශිර්වාදය ලබාගත නොහැකි අතර ශබ්දය, ධ්වනිය කෙරෙහි ද විශේෂ අවධානයක් යොමුකළ යුතුය. පිරිතේ ආශිර්වාදය, ආරක්ෂාව ලබාගැනීමේ දී අර්ථ ගාම්භීරය පමණක් සැලකිය නොහැකි අතර අක්ෂර ගැලපීම, ධ්වනිය, චාරිත්‍ර වාරිත්‍ර, පූජා විධි, මනා දේශනා හැකියාව, වාග් සංයමය, නිවැරදි වාග් උච්චාරණය වැනි සියල්ල කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර එසේ කිරීමෙන් ම පමණක් පිරිතෙන් අපේක්ෂිත නියම ප්‍රතිඵල ලබාගත හැකිය.

අද ඇතැම් පිරිසක් විසින් පාලියෙන් සුරැකිව පවත්වාගෙන ආ පිරිත සරල සිංහලට නගා සිංහලෙන් කීමේ සම්ප්‍රදායක් පටන් ගෙන ඇත. පාලි පිරිත ඕනෑම අයෙකුට තම භාෂාවට පරිවර්තනය කිරීමට හැකියාවක් ඇත. සිංහල, ඉංග්‍රීසි, දෙමළ, තායි, බුරුම, චීන වැනි වෙනත් භාෂාවකට පරිවර්තනය කොට එය කියවීම හෝ ගායනා කිරීම පිරිත් කීම වශයෙන් අර්ථ ගැන්විය නොහැකිය. ඒ සන්නය හෙවත් අර්ථය කීමක් පමණි. එහෙයින් පිරිත් දේශනාවේ දී අක්ෂර නිවැරදිව උච්චාරණය කිරීමේ වැදගත්කම අවධාරණය

කෙරෙන අතර එසේ දේශනා කරවා ගැනීමෙන් ම පමණක් පිරිතෙන් ලබාගත හැකි නියම ප්‍රතිඵලය, ආශිර්වාදය, ශාන්තිය ලබාගත හැකිය. නැතහොත් අර්ථය කීමෙන් පිරිතෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගත නොහැකිය.

ත්‍රිපිටකයෙන් තෝරාගත් පාලි සූත්‍ර ඇතුළත් පිරිත් සජ්ඣායනය පාලියෙන් ම පවත්වාගෙන යෑම සම්ප්‍රදායික ස්වරූපය වෙයි. පොදුජන ව්‍යවහාරයකට වඩා පාලියෙන් ම ත්‍රිපිටක සූත්‍ර තැබීම ධර්මයේ සුරක්ෂිතතාව පිණිස ද හේතු වෙයි. වෙනත් භාෂාවකට පරිවර්තනය කිරීම ඔවුන්ට අර්ථය තේරුම් ගැනීම සඳහා පමණක් හේතු වන්නෙකි. ලංකාව, තායිලන්තය, බුරුමය වැනි සෑම බෞද්ධ රටකම පිරිත පාලියෙන් ම සජ්ඣායනා කරනු ලැබේ. එබැවින් පාලිය තුළ පොදු භාෂා අනන්‍යතාවක් ගොඩනැගී තිබීම ද ඉතා වැදගත් ය. බුද්ධ දේශනාවේ අනන්‍යතාව පවතින්නේ පාලි භාෂාව තුළ මිසක් පරිවර්තනය කළ වෙනත් භාෂාවක් තුළ නොවේ. පිරිත සිංහලට හෝ වෙනත් බසකට පරිවර්තනය කොට කිවහැකි වුවත් එය පිරිතෙහි තේරුම මිස ආරක්‍ෂාව සපයන පරිත්‍රාණ දේශනාව නොවේ.[21] එබැවින් පිරිතේ ආශිර්වාදය ලබා ගැනීමට බුද්ධ දේශනා පාලියෙන් ම දේශනා කළ යුතුය.

## වැරදි ලෙස පාලි ගාථා උච්චාරණය

අප සමාජයේ ඇතැම් පිරිස් විසින් පිරිත් සජ්ඣායනයේ දී මෙන් ම එදිනෙදා භාවිත පාලි ගාථා කීමේ දී ද වැරදි ලෙස පාලි පාඨ උච්චාරණය කරන අයුරු දැකිය හැකිය. එවිට එම ගාථාවල නියම අර්ථය විකෘති වීම වළක්වනු නොහැකිය. අද එලෙස පාලියෙහි අර්ථ විකෘති කරන අවස්ථා කීපයක් දැකිය හැකිය.

'නක්ඛත්තයක්ඛභූතානං...' යන ගාථාවේ අවසාන පාදයේ දී 'හොන්තු තෙසං උපද්දවේ' යනුවෙන් ඇතැම්හු උච්චාරණය කරති. එහෙත් 'හොන්තු' යන්න 'හන්තු' විය යුතුය. 'සියලු උවදුරු නැසේවා' යන අර්ථ ලැබෙන්නේ 'හන්තු' යන්න යෙදීමෙන් පමණි. 'හොන්තු' යනු 'වෙත්වා' යන අර්ථ දෙන ප්‍රාර්ථනා ක්‍රියා පදයකි.

එබැවින් අර්ථය සම්පූර්ණයෙන් විකෘති වීමකි. එසේම 'ඉච්ඡිතං පත්ථිතං' යන ප්‍රාර්ථනා ගාථාව ඇතැම්හු 'ඉච්ඡිතං පච්චිතං' යනුවෙන් වැරදි ලෙස උසුරුවති. ඒ අර්ථය දැන නොව, ශ්‍රවණයට අනුව හුරුවීමෙනි. 'පත්ථිතං' යනු යම් කැමැති දෙයක් ප්‍රාර්ථනා කරන' යන අර්ථයි. එහෙත් 'පච්චිතං' යනුවෙන් කීවොත් එයින් 'පිසින ලද යමක්' පිළිබඳ අර්ථ දෙයි. එය ගාථාවට සම්පූර්ණයෙන් ම දූෂිත අර්ථයක් ගෙන දෙන්නක් වෙයි.

දෙවියන්ට පින් අනුමෝදන් කිරීමේ දී 'එත්තාවතා ච අම්මේහි' යනුවෙන් කියන අයුරු ඇසිය හැකිය. එහෙත් 'අම්මේහි' යන්නෙන් අර්ථයක් ලබා ගත නොහැකිය. එය 'අම්හෙහි' 'අප විසින්' යනුවෙන් නිවැරදි විය යුතුය. මෙම ගාථාවේ ම 'සම්පදං පුඤ්ඤසම්පදං' යනුවෙන් වහරනු ආකාරයක් ද දැකිය හැකිය. එය 'සම්භතං පුඤ්ඤසම්පදං' යනුවෙන් නිවැරදි විය යුතුය. 'සම්භතං' යනු රැස්කළ යන අර්ථයි.

පියාට වඳින ගාථාවේ 'වුද්ධිකාරො අලිංගිත්වා' යනුවෙන් වැරදි ලෙස වහරනු ඇසිය හැකිය. එහි අර්ථය විමසීමෙන් 'ආලිංගිත්වා' යනුවෙන් නිවැරදි විය යුතු බව පෙනේ. 'ආලිංගිත්වා' යනු වැළඳගෙන යන අර්ථය ගෙන දෙන අතර අලිංගිත්වා වැරදි ලෙස භාවිත පදයක් සේ පැහැදිලි වේ.

'ඉතිපි සො භගවා' ගාථාවේ 'පුරිසදම්මසාරථී' යන බුදුගුණය 'පුරිසධම්මසාරථී' යනුවෙන් 'දම්ම' වෙනුවට 'ධම්ම' යනුවෙන් උච්චාරණය කරනු ශ්‍රවණය වේ. 'දම්ම' යනු දමනය කළ, හික්ම වූ යන අර්ථය ගෙන දෙයි. එහෙත් 'ධම්ම' යනුවෙන් උච්චාරණය වීමෙන් මූල අර්ථයට හාත්පසින් ම වෙනස් අර්ථයක් ඇති කෙරෙන අයුරු දැකිය හැකිය.

'නමාමි බුද්ධං ගුණසාගරන්තං' ගාථාවේ කායො ජිගුච්ඡො සකලො දුගන්ධො' වෙනුවට 'සුගන්ධො' යනුවෙන් භාවිත කරන අයුරු දැකිය හැකිය. මල් පූජා කිරීමේ ගාථාව කීමේ දී 'වණ්ණගන්ධ ගුණොපෙතං එතං කුසුම සන්තතිං' යන්නෙහි 'සන්තතිං' වෙනුවට 'සන්තසින් හෝ සන්තොසින්' යනුවෙනු වැරදි ලෙස උසුරනු ඇසෙනු ලැබේ. එය 'සන්තතිං' යනුවෙන්

නිවැරදි විය යුතු අතර එයින් 'සමූහය' යන අර්ථය ගෙනදෙයි.

'සබ්බේ බුද්ධා බලප්පත්තා' යන ආරක්‍ෂක ගාථා සජ්ඣායනයේ දී ඇතැමුන් විසින් 'රක්ඛං බන්ධාමි සබ්බසො' වෙනුවට 'වන්දාමි' යනුවෙන් භාවිත කරනු ලැබේ. 'වන්දාමි' යනුවෙන් යෙදුවහොත් ගාථාවෙන් අපේක්‍ෂිත අර්ථය සම්පූර්ණයෙන් ම වෙනස් වේ. 'සියල්ලෙන් ආරක්‍ෂාව පිණිස බඳිමි' යන අර්ථය ගෙන දීම සඳහා 'බන්ධාමි' යනුවෙන් ම එහි දී භාවිත කළ යුතුය.

'සබ්බපාපස්ස අකරණං' ගාථාවේ අවසාන පාදය 'එතං බුද්ධානසාසනං' සහ 'එතං බුද්ධානුසාසනං' යනුවෙන් දෙයාකාරයකින්ම භාවිත කරනු අයුරු ශ්‍රවණය වේ. එහෙත් වඩා නිවැරදි භාවිතය වනුයේ 'බුද්ධානං සාසනං' මිස 'බුද්ධානු සාසනං' යනුවෙන් නොවේ. සියලු බුදුවරුන්ගේ අනුශාසනාවයි යන අර්ථය දීම සඳහා 'බුද්ධානසාසනං' නිවැරදි රූපය වේ.

පිරිත් පොතේ මිත්තානිසංස සූත්‍රයේ ඇතුළත් 'පුත්තානං ඵලමස්නාති යො මිත්තානං න දූහති' ගාථාවේ 'පුත්තානං ඵලමස්නාති' යන්න විමසිය යුත්තෙකි. එහෙත් ජාතක පාලියෙහි හා අටුවාවෙහි මෙම ගාථාවේ 'පුත්තානං' යන්න යොදා ඇත්තේ 'වුත්තානං' යනුවෙනි. බුරුම සංස්කරණයෙහි යෙදෙන්නේ අනුස්වාරය රහිතව 'වුත්තාන ඵලමස්නාති' යනුවෙනි. ඒ අනුව වුත්ත ශබ්දයට ඉතිවුත්තකපාලි අටුවාව දී ඇති අර්ථ අතර 'වපනේ' වැපිරීමෙහි යන අර්ථය ද වෙයි. පළමුව 'ඛෙත්තෙ වුත්තං විරූහති' යනු 'කෙතෙහි වැපිරූ දෙය මනාව වැඩෙයි' යන අර්ථයි. දෙවනුව වුත්තානං ඵලමස්නාති යනු 'ඒ වැපිරූ ධාන්‍යවල ඵල හෙවත් අස්වැන්න අනුභව කරයි' යනුවෙන් අර්ථ නිවැරදි විය යුතුය. මෙහි 'ඵලං' යනු නාමපදයයි. අස ධාතුව භක්ඛණෙ (අනුභව කිරීමෙහි) අර්ථයෙන් 'අස්නාති' යන ආඛ්‍යාත පදය නිර්මිතයි. 'අස්නාතීති පරිභුඤ්ජති' යනු අටුවා විග්‍රහයයි. ඒ අනුව අස්නාති යනු අනුභව කරයි යන අර්ථයි. මෙම විග්‍රහ කිරීම්වලට අනුව වැපිරූ ධාන්‍යවල ඵලය, අස්වැන්න අනුභව කරයි යන අර්ථය ගෙනදෙන පරිදි 'පුත්තානං' නොව 'වුත්තානං ඵලමස්නාති' යනුවෙන් නිවැරදි විය යුතු තැනෙකි.

මෙසේ අප දෛනික ජීවිතයේ දී භාවිත කරන බොහෝ පාලි ගාථා තවදුරටත් සාවද්‍ය ලෙස භාවිත කිරීම අතහැර නිවැරදි ලෙස භාවිත කිරීමෙන් එයින් නියම ප්‍රතිඵල ලබා ගැනීමට හැකියාව ලැබේ. අප මෙතෙක් වැරුද්දූ තැන් නිවැරදි කර ගැනීමට පාලි භාෂාව පිළිබඳ නිවැරදි අවබෝධයක්, දැනුමක් ලබා ගැනීම බෙහෙවින් උපකාරි වේ.

## භාණක ක්‍රමවේදයක් නැවත ස්ථාපිත කිරීම

යම් ධර්මදේශකයෙක් දීඝනිකාය ඇසුරෙන් ධර්ම දේශනාවක් සිදුකරනුයේ නම් පෙළ මෙන්ම එහි අටුවාව වූ සුමංගලවිලාසිනියත් ඇසුරු කිරීම ම එම ධර්ම දේශනාවේ සාර්ථකත්වය සඳහා හේතු වෙයි. මජ්ඣිමනිකායෙන් ධර්ම දේශනා කරනුයේ නම් එහි අටුවාව වූ පපඤ්චසූදනියත් සංයුක්ත නිකායෙන් නම් සාරත්ථප්පකාසිනියත් අංගුත්තරනිකායෙන් නම් මනෝරථපූරණියත් ඇසුරු කරමින් ධර්ම දේශනා කිරීම ම එහි මනා සාර්ථකත්වයයි. ඛුද්දකනිකායේ එක් එක් ග්‍රන්ථයන් වෙන වෙනම ධර්ම දේශනා හෝ ධර්ම සාකච්ඡා සඳහා යොදා ගැනීමත් ඒවාට අදාළ අටුවාවත් ඒ සමග ම භාවිත කිරීමත් තමන් සිදුකරන කාර්යයේ සාර්ථකත්වයේ මූලික කාරණයයි. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම තෙක් ත්‍රිපිටකය භාණක පරම්පරාවන් විසින් මුඛපරම්පරාගතව පැවත ගෙන ආවේ මේ අයුරිනි. එහෙත් බොහෝ දුරට අද සිදුවනුයේ එසේ පූර්ණ පරිශීලනයකින් තොරව සරලව අධ්‍යයනය කිරීමකි. දීඝභාණක, මජ්ඣිමභාණක, සංයුක්තභාණක, අංගුත්තරභාණක තෙරවරුන්ගේ මූලික කාර්යය වූයේ පෙළත් අට්ඨකථාවත් ටීකාවත් ඇසුරෙන් ඒවා පවත්වාගෙන ඒමයි. ජාතක භාරව සිටි හිමිවරුන් ජාතක පාළියත් ජාතකට්ඨකථාවත් ඇසුරු කරමින් ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා පැවැත් වූ අතර ඒ අනුව ජාතක භාණක පැවත එන්නට විය. ධර්ම කරුණු විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කිරීමට දක්ෂ තෙරුවරුන් සුත්තනිපාතය, පේටකෝපදේසය, නෙත්තිප්පකරණය, මිලින්දපඤ්හය වැනි ග්‍රන්ථ ඇසුරු කරමින් ධර්ම දේශනා කිරීම එම කොටස් පිළිබඳ දේශකයාටත් ශ්‍රාවකයන්ටත් නිවැරදි

අවබෝධයක් ලබාගැනීමට උපකාරි වේ. එහෙත් වර්තමානයේ පෙළ, අටුවාව මුල්කරගනිමින් භාණක පරම්පරාවන් විසින් මුඛපරම්පරාගතව බෞද්ධ දර්ශනය පවත්වාගෙන ආ ආකාරයට කටයුතු කරනුයේ ඉතාම සුළු පිරිසක් විසින් පමණක් බව ඉතා පැහැදිලිය.

විවිධ පුද පූජා පැවැත්වීමේ දී භාවිත කරන විවිධ ගද්‍ය පද්‍ය කොටස් වෙනුවට පටිසම්භිදාමග්ගය වැනි ධර්ම ග්‍රන්ථ ඇසුරෙන් සිදුකරනුයේ නම් එහි වැදගත්කම මෙන්ම එහි උපයෝගිතාව වඩා ඵලදායිකය. අර්ථ සමපන්නය. එසේ සිදුවුවහොත් අපට නැවත දීඝභාණකයන්, මජ්ඣිමභාණකයන්, ජාතකභාණකයන්, ධම්මපදභාණකයන් ඇති කළ හැකිය. අද මිනිසුන්ට මේ අයුරින් ධර්මය සමීප කිරීම ඉතා පහසු කාර්යයන් නොවනු ඇත. එහෙත් අද අපට කළ යුතුව ම ඇති කටයුත්ත ද මෙය බැව් අපගේ හැඟීමයි. මුළු ත්‍රිපිටකය අසුරු කරමින් මෙය කිරීමට අපහසු වුවත් එක නිකායක් හෝ එක ග්‍රන්ථයක් හෝ නිවැරදිව පෙළත් අටුවාවත් ඇසුරෙන් උද්ග්‍රහණය කිරීමට, දේශනා කිරීමට හැකි වන්නේ නම් නිවැරදිම පියවර එයයි. භික්ෂුවගෙන් අහිමි වූ භාණක පරම්පරාව භික්ෂුව විසින් ම නැවත ඇති කළ යුතුයි.

අද නිවැරදි ලෙස ධර්මය සන්නිවේදනය කිරීමේ ප්‍රබල අර්බුදයක් උද්ගතව ඇත. සම්බුද්ධ ශාසනය මුහුණ පා ඇති මෙම මහත් ව්‍යසනයෙන් මගහරවා ගැනීමට නම් කළ යුතුම කටයුත්ත මෙම මූලික කටයුත්ත එකතු කිරීමයි. නැවත භාණක පරම්පරාවන් ඇති කිරීමයි. විවිධ නිකාය, ග්‍රන්ථ මූලික කරගනිමින් රටපුරා, ලොව පුරා නිවැරදි ධර්මය දේශනා වේ නම් අප සම්බුද්ධ ශාසනය නැවත උද්දීපනය වනු නිසැකය. අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ දැක්වූ 'ධම්මො විවටො විරොචති නො පටිච්ඡන්නො' යන්න ප්‍රත්‍යක්ෂ වනු නිසැකය.

පිරිවෙන් අධ්‍යාපනයේ දී මෙන් ම ප්‍රාචීන අධ්‍යාපනයේ දී ද විශ්වවිද්‍යාලයේ දී ද පාලි, බුද්ධධර්මය හැදෑරීමට සිදු වී ඇත්තේ විෂය නිර්දේශයකට අනුව යම්කිසි රාමුවක් තුළ සිටය. උසස් අධ්‍යාපනයේ දී ත්‍රිපිටකය, අටුවාව ගැඹුරින් නිවැරදිව සම්පූර්ණයෙන් අධ්‍යයනය කිරීම වෙනුවට තමන්ට අදාළ විභාග

සඳහා පමණක් නිර්දේශිත ධර්ම කොටස් පමණක් ප්‍රගුණ කිරීමට බොහෝ විට වත්මන් තරුණ භික්ෂුවට සිදු වී ඇත. විශ්වවිද්‍යාලයේ දී පාලි අධ්‍යයන කරන සිසුවෙකුට සිදුවනුයේ සමාසිකාන්ත ක්‍රමය යටත් ඉතා සීමිත විෂය කොටසක් පමණක් තම අධ්‍යයන කාලය තුළ දී හැදෑරීමටය. බොහෝ ශිෂ්‍ය හිමිවරුන්ගේ මූලික අපේක්ෂාව වනුයේ තම උපාධිය සම්පූර්ණ කරගැනීම විනා ත්‍රිපිටකය, අටුවාව පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා ගැනීම නොවේ. වර්තමාන අධ්‍යාපන ක්‍රමය ගමන් කරන ආකාරය මෙයයි. මේ අයුරින් පාලි ත්‍රිපිටකය පිළිබඳ විශාරදයෙක් බිහිවීම බලාපොරොත්තු වීම දුෂ්කරය.

### පාලි භාෂා අධ්‍යයනයෙහි වැදගත්කම

අතීතයේ පිරිවෙන් අධ්‍යාපන තත්වය තුළ ප්‍රමුඛ තැනක් දී තිබුණු පාලි, සංස්කෘත, ප්‍රාකෘත භාෂා අධ්‍යයන අද බෙහෙවින් අභාවයට පත්වෙමින් පවතී. විසිඑක් වන සියවසට අවශ්‍ය පරිදි සියල්ල තාක්ෂණික විෂයන් සමග සමගාමී වෙමින් පාරම්පරික භාෂා ඥානය ලබාදුන් සාම්ප්‍රදායික අධ්‍යාපන රටාව දිනෙන් දින දුරස්ථ වෙමින් පවතී. මෙම දුරස්ථ වීම නිසා ජාතික විශ්වවිද්‍යාලවල පෙරදිග භාෂා උගන්වන අධ්‍යයන අංශ ඒවා පවත්වාගෙන යෑමට පවා දුෂ්කරතාවන්ට පත්වෙමින් පවතී. පාලි සංස්කෘත ප්‍රාකෘත වැනි පෙරදිග භාෂා කිසියම් පාඨමාලාවක් තුළට පමණක් සීමා කර පැවතීම පමණින් මෙම ව්‍යාකූලත්වයෙන් මගහැරීමට පිටිවහලක් නොවනු ඇත. පෙරදිග භාෂාවන්ගේ වටිනාකම, ඵලදායිතාව පෙන්වා දෙමින් නැවත ලක්දිව තුළ පෙරදිග භාෂා විෂයයන් කෙරෙහි පෙලඹවීමක් කළයුතු කාලය එළඹ ඇත.

පාලි සංස්කෘත වැනි පෙරදිග භාෂා විෂයන් පිළිබඳ අඩු තක්සේරුවකින් කතාකරන ඇතැමුන් පවසන්නේ විද්‍යා, තාක්ෂණ දැනුමෙක් කළ හැකි කිනම් දෙයක් මළ භාෂා ඉගෙනීමෙන් කළ හැකිද යනුයි.  මිනිසාගේ මානසික ගැටලු, අසන්තෘෂ්ටිය ආදී තත්වයන් සියල්ල නවීන විද්‍යා තාක්ෂණයෙන් හෝ වාණිජ තත්වයන්ගෙන් විසඳාගත හැකි නම් එම ප්‍රකාශනය සාධාරණය. එහෙත් මානව ශාස්ත්‍ර විෂයන්ගෙන් ලබාදෙන විසඳුම්, මානසික

සහන නවීන විද්‍යාවෙන් ලබා ගත නොහැකි බැවින් වත්මන් බොහෝ විද්වත් පිරිසක් නැවත මානව ධර්ම ශාස්ත්‍ර අධ්‍යයනයෙහි නිරත වෙමින් සිටී.

බටහිර විද්වතුන්ගේ අවධානය මානව ශාස්ත්‍ර වෙත අවම ලෙස යොමු වුවත් ලක්දිව අපට පාලි, සංස්කෘත, ප්‍රාකෘත භාෂාවලින් තොරව කථාකළ නොහැකිය. ශ්‍රී ලාංකේය අනන්‍යතාව, සංස්කෘතිය, ශිෂ්ටාචාරය සියල්ල බැඳී පවතින්නේ පාලි භාෂා සාහිත්‍ය පදනම් කරගෙනයි. පාලියත් සිංහලයත් ඉන්දු ආර්ය භාෂා පවුලේ සමාන ලක්‍ෂණයන්ගෙන් යුක්ත භාෂාද්වයකි. සිංහල සාහිත්‍යයේ සංවර්ධයනට හා ව්‍යාප්තියට මුඛ්‍ය ආධාරය වනුයේ පාලියයි. අනුරාධපුර, පොළොන්නරු අවධීන්හි සිංහල පාලි සම්පර්කය නිසා පෘථුල ලංකා සාහිත්‍ය ඉතිහාසයක් භාෂාද්වයෙන් ම අපට උරුම වේ.

පාලිය අජීවි බසක් නොව සජීවි බසක් ලෙස සැලකීමට මෙම සම්බන්ධය ම ප්‍රමාණවත් වනු ඇත. යම් භාෂාවක් කථා කළ පමණින්ම සජීවි බසක් වශයෙන් සැලකීම නුසුදුසුය. එහි ජීවි අජීවි බව රඳා පවතින්නේ එම භාෂාවේ උපයෝගිතාව මතය. පාලි භාෂාව කථා කරන ජන කණ්ඩායමක් අද ලෝකයේ කිසිදු ප්‍රදේශයකින් හමු නොවෙතත් පාලියෙන් විරචිත පෘථුල බෞද්ධ දර්ශනය ලෝකයේ සෑම අයෙක් විසින් ම අධ්‍යයනය කරනු ලැබේ. පාලිය අතීතයේ මගධයේ, කෝසලයේ හෝ කිනම් ප්‍රදේශයක පැවැති පැරණිතම භාෂාවක් වුවත් ත්‍රිපිටක දේශනාව එදා සිට අද දක්වාම වාහක මාධ්‍යය කරගනුයේ පාලි භාෂාවයි. අද බුද්ධ වචනය කවර භාෂාවකින් පරිවර්තනය කර ඉගෙනීමට අවකාශ ඇති නමුත් එහි යථාර්ථය තුලනා අධ්‍යයනය කිරීමට පාලි භාෂාව අධ්‍යයන කළ යුතුම වෙයි. මූලයෙන් තොරව කිසිදු පදාර්ථයක් නිවැරදිව හැදෑරීම සාර්ථක අධ්‍යයනයක් නොවේ.

පාලිය ඉන්දියාවේ කිනම් ප්‍රාන්තයක උප භාෂාවක් වශයෙන් ජනිත වුවත් අද බුද්ධ දේශනාව ලෝකයට ගෙනයන ප්‍රධාන භාෂා මාධ්‍යය වීමෙන් වෙනත් කිසිදු භාෂාවකට ලබාගත නොහැකි විශ්වජනිත භාෂා තත්වයක් පාලියට හිමි වෙයි. පාලිය ථෙරවාදී බුද්ධ ධර්මය පවතින රටවලට පමණක් සීමා වූ භාෂාවක්

නොවේ. පාලියෙන් ඉදිරිපත් කෙරෙන බෞද්ධ දර්ශනයෙහි ඇතුළත්ව ඇත්තේ ජාති, කුල, ආගම් භේදයකින් සීමා නොවන විශ්ව මානව සාහිත්‍යයකි. මහායාන බෞද්ධ දර්ශනය සංස්කෘත, තිබ්බතීය, චීන, ජපන්, කොරියන් භාෂාවලින් ප්‍රචලිතව ඇතිමුත් මූලික බුදුදහම අඩංගුවන පාලි ත්‍රිපිටක සාහිත්‍යයෙන් තොරව තුලනාත්මක අධ්‍යයනයක් සිදුකළ නොහැකිය. ථෙරවාදීන් විසින් පාලි ත්‍රිපිටකය පාලියෙන් ම මුඛපරම්පරාගතව පවත්වාගෙන අවුත් ග්‍රන්ථාරූඪ කිරීම දක්වා සුරක්ෂිත කොට ස්ථාපිත කළ බැවින් මූලික බුදුදහම පිළිබඳ අධ්‍යයනයට පාලිය අවශ්‍යය ම වෙයි.

බුදුදහම මිනිසාගේ යථාර්ථය ඉදිරිපත් කරන ශ්‍රේෂ්ඨ දර්ශනයකි. එම විශිෂ්ට දර්ශනය ඉගැන්වෙන පාලි භාෂාව එක් ජන කණ්ඩායමකට හෝ වර්ගයකට හෝ රටකට පමණක් සීමා නොවන විශ්වජනීන තත්වයෙක් ලබාගෙන ඇත.[22] නීතිය, දර්ශනය, මනෝවිද්‍යාව, උපදේශනය වැනි විෂයයන් අද බහුල වශයෙන් බෞද්ධ දර්ශනයෙන් පෝෂණය වන නිසා පාලියේ වැදගත්කම බෙහෙවින් තීව්‍ර වේ.

ලංකාව ලෝකයට පළමුවෙන් ගෙනගියේ පාලි භාෂාවයි. අපගේ ඉතිහාස කථාව ලෝකය හමුවේ දිගහැරුණේ පාලි භාෂාවෙනි. පාලියෙන් අප තරම් ඵල ප්‍රයෝජන ලබාගත් වෙනත් කිසිදු රටක් නොමැත. එහෙත් අද පාලි අධ්‍යයනයට, භාවිතයට, පරිශීලනයට උදාසීනත්වයක් පළ කරන්නේ කිනම් කාරණයක් නිසාදැයි අප විසින් ම නැගිය යුතු ප්‍රශ්නයකි. අපගේ ප්‍රෞඪ ඉතිහාසය නොදැන පාලියට ලබාදෙන අඩු සැලකිල්ල දැන් ඉවත් කළ යුතු කාලය එළඹ ඇත. අපේ ඉතිහාසය ලෝකයට ගෙනයෑමට අපට ලැබුණු වටිනාම දෙය පාලි භාෂාවයි. නිර්මල ථෙරවාදී බුදුදහම සුරක්ෂිත කොට පාලි භාෂාවෙන් ලියා තැබීමේ ගෞරවය හිමිවන්නේ ලාංකිකයන්ට පමණි. ඒ උදාර සත්කාර්යය එදා සිදුකළ මුත් අද ඒ පිළිබඳ සිහිපත් කරනුයේ ද අතලොස්සක් පමණි. නැවත පාලි භාෂාව සුරක්ෂිත කිරීමට විවිධ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. ඒ සඳහා විශ්වවිද්‍යාල, පිරිවෙන් ආයතන මෙන් ම පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ද යොමු විය යුතුම වෙයි. නැතහොත් අපගේ ප්‍රෞඪ ඉතිහාසය ලියා ඇති මුල් ම

භාෂාව පාලිය යැයි උදම් අණමින් සිටීම පමණක් ප්‍රමාණවත් නොවනු ඇත.

පාලියෙහි වටිනාකම අපට වඩා අද වටහාගෙන ක්‍රියාකරන්නේ බටහිර විද්වතුන්ය. රීස් ඩේවිඩ්ස් එංගලන්තයෙන් මෙරටට පැමිණ ලබා ගන්නේ පාලි භාෂාවේ දැනුමයි. අපට හිමිව තිබූ පාලිය ස්ථාපිත කොට ව්‍යාප්ත කිරීමට ප්‍රාමාණික සංවිධානත්වයක් නොවුණු හෙයින් අද වන විට පාලියෙහි ආධිපත්‍යය උසුලනු ලබන්නේ රීස් ඩේවිඩ්ස්ගේ මූලිකත්වයෙන් පිහිටු වන්නට යෙදුණු එංගලන්තයේ පාලි පොත් සමාගමයි. ඔහුගෙන් පාලි භාෂාවට සිදු වූ අමිල මෙහෙය වල්පොල රාහුල හිමියන් විසින් ප්‍රශංසා මුඛයෙන් පවසන්නේ මෙසේය. 'රීස් ඩේවිඩ්ස් විසින් පාලි අධ්‍යයනයට කරන ලද විවිධ සේවාවන් අතුරින් ශ්‍රේෂ්ඨතම මෙහෙය වූයේ පාලි පොත් සමාගම පිහිටුවීමයි. මෙම පොත් සමාගමේ අරමුණ වූයේ පැරණිතම බෞද්ධ සාහිත්‍යයෙන් පිරුණු ගබඩා ශිෂ්‍යයන්ට විවෘත කර තැබීමය.' බටහිර විද්වතුන් පාලි භාෂාව ඉගෙන අනතුරුව ක්‍රියාත්මක වූයේ බුදුදහමත් පාලියත් ලෝකයට ව්‍යාප්ත කිරීමයි. අද බටහිර ලෝකයේ බොහෝ විශ්වවිද්‍යාලවල බුදුදහමත් පාලියත් ප්‍රධාන විෂයක් වී අධ්‍යයනය කරනු ලබයි. විවිධ බෞද්ධ සංවිධාන, ආයතන, සමිති පිහිටුවා බෞද්ධ දර්ශනයත් පාලි භාෂාවත් ඉගෙනීමට ක්‍රියාත්මක වී ඇත. ලක්දිව සිංහලෙන් ප්‍රකාශයට පත්වෙන බෞද්ධ කෘතිවලට වඩා බටහිර විද්වතුන් විසින් බෞද්ධ දර්ශනය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන කෘති විශාල වශයෙන් ව්‍යාප්තියට ද හේතුවෙයි. සිංහල කෘති කියවීමට හැකිවන්නේ සීමිත පිරිසක් සඳහා වන අතර ඉංග්‍රීසියෙන් රචිත කෘතිවලින් ලැබෙන ප්‍රයෝජන ඊට වඩා වැඩිය. ඒ බොහෝ දෙනෙක් පරිශීලනය කරන නිසාවෙනි.

අද වන විට පාලි පොත් සමාගම පිහිටුවා සියලුම ත්‍රිපිටක පොත් රෝමන් අකුරෙන් පෙරළා සියලු ම පෙළ පොත්වලට ඉංග්‍රීසි පරිවර්තන සිදුකර තිබීම නිසා පාලියෙත් බෞද්ධ දර්ශනයත් ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන්නට මූලාධාර වී ඇත. පෙළ පමණක් නොව අටුවා කෘති සියල්ල ම ද රෝමන් අක්ෂරවලට පරිවර්තනය කර තිබේ. එහෙත් රෝමන් ගතකර ඇති ටීකා

කෘති ප්‍රමාණය ඉතා සීමිතය. ග්‍රන්ථ සංස්කරණ ක්‍රමවේදයන්ට අනුව මුල්ම ටීකාව රෝමන් අක්ෂරවලින් පරිවර්තනය කරනුයේ මහාචාර්ය ලිලී ද සිල්වා මැතිණිය විසිනි. රෝමන් ගතකිරීමට තව බොහෝ ටීකා ප්‍රමාණයක් ඉතිරිව ඇත. පෙළ සම්පාදනය, ඉංග්‍රීසි පරිවර්තන සිදුකිරීම ආදි මේ සියලු ම කාර්යයන් සඵල කරගැනීමට මහත් වෑයමක් ගන්නා ලද්දේ පාලි පොත් සමාගම විසිනි. මෙය ඉතා දුෂ්කර කාර්යයකි. මෙම සංස්කරණ, පරිවර්තන කාර්යයට ලාංකේය විද්වතුන්ගෙන් ලැබී ඇති දායකත්වය ඉතා සීමිත වෙයි. බොහෝ පොත් ප්‍රමාණයක් පරිවර්තනය වී ඇත්තේ ඉංග්‍රීසි ජාතිකයන් විසින්මය. ඉංග්‍රීසි භාෂා දැනුම පිළිබඳ ඇති ගැටලුව මේ සඳහා හේතු වන්නට ඇත. අද වුව ද විධිමත් කණ්ඩායමක් යටතේ ත්‍රිපිටක ග්‍රන්ථ සංස්කරණය සහ පරිවර්තන ක්‍රියාවලිය ලක්දිව ක්‍රියාත්මක වන්නේ නම් සමස්ත ලෝකයේ ම අවධානය අප වෙත නැවත යොමුවනු නිසැකය.

පාලි, බුද්ධ ධර්මය වැනි විෂයන් සමග විදේශීය භාෂාවක් ඉගෙන ගත් ඕනෑම අයෙකුට ලෝකයේ ඕනෑම රටකට පහසුවෙන් ඇතුළු වීමට හැකිවනු ඇත. පාලි භාෂාව හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රාමාණික අවබෝධයකින් යුක්ත වූයේ නම් ඔහුට ලෝකයේ බෞද්ධ ක්ෂේත්‍රයේ ඕනෑම අංශයක් විවෘතව ඇත. පෙළ, අටුවා, ටීකා පිළිබඳ ප්‍රාගුණ්‍යයකින් හෙබි බොහෝ ලාංකික විද්‍යාර්ථීන්ට ජාත්‍යන්තර භාෂා හැකියාවක් නොමැති හෙයින් තමන් දක්ෂතා සමගින් ලෝකය සමග එකතු වීමට අවකාශ අවහිර වී ඇත. ඉංග්‍රීසි භාෂා හැකියාවෙන් හෙබි ඇතැමුන්ට පාලිය පිළිබඳ ගැඹුරු දැනුමක් නොමැත. මෙම අඩුව නොවන්නට ලෝකයේ ඕනෑම අංශයක පහසුවෙන් රැකියාවක්, උපාධියක්, තනතුරක් ලබා ගැනීමට පාලි භාෂාවට හැකියාවක් ඇත. එනිසා පාලිය යනු අජීවි, මළ භාෂා යන සංකල්පයෙන් මිදී ලෝකයේ දොරගුළු විවෘත කරගැනීමට පහසුම මාර්ගය පාලිය බව මැනවින් අවබෝධ කර ගෙන ඒ අනුව කටයුතු කිරීමට අප විද්‍යාර්ථීන් තැනිය යුතුය.

## ආන්තික සටහන්

1. Karashima, Seishi & Wille, Klaus (2006), *Buddhist Manuscripts from Central Asia*, The British Library Sanskrit Fragments, Tokyo: Soka Unviersity, Vol. I.

2. Norman, K.R. (1976) 'the Language in which the Buddha taught', *Collected Paper II*, Oxford: The Pali Text Society, pp. 128-147
3. සුඛෙ, දුක්ඛෙ, ජීවෙ. සාමාන්‍ය රූපය නම් ඒවා සුඛං, දුක්ඛං, ජීවො යනුවෙන් යෙදී තිබිය යුතු බවයි. එහිද බුධෙ ජතෙ සක්‍යමුනි, සිලා ඵහෙව උසාපිතෙ' වැනි තැන්වල එ අන්ත රූප දක්නට ලැබේ.
4. ආනන්ද කුලසූරිය, *ගතක් සැකසීම*, 4 පිටුව
5. *දීඝනිකායට්ඨකථා, 1* පිටුව
6. පණ්ණකාරෙ ච ලෙඛං ච, *මහාවංස*, පරි. 7, 51 ගාථාව.
7. ලෙඛං දත්වාන පෙසෙසි, *-එම-* 57 ගාථාව.
8. රාජා ලෙඛං කුමාරසි, *-එම-* පරි. 10, 1 ගාථාව.
9. ආනන්ද කුලසූරිය, *ගතක් සැකසීම*, ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩලයේ ප්‍රකාශනයෙකි, ශ්‍රී දේවි ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් මුද්‍රණාලය, නැදිමාල, දෙහිවල, 1992, 4 පිටුව.
10. *දීඝනිකායට්ඨකථා*, සයිමන් හේවාවිතාරණ සංස්කරණය, ත්‍රිපිටක මුද්‍රණාලය, 1925, 1 පිටුව.
11. *මහාවංස*, පරි. 23, 25-33-35 ගාථා
12. අථ කෙතකී පත්තම්හි ලිඛිත්වා හට්ඨමානසො
සංසභොගං විහාරස්ස තස්සපාදා මහීපති, *මහාවංස*, පරි. 33, 49-51 ගාථා
13. -එම- පරි. 33, 102-3 ගාථා
14. මණ්ඩපං මහාරාජ කාරාපෙතුං සබ්බං පොත්ථකාපණ්ණං සම්පාදෙතුං ච වට්ටතීති, *Saddhammasangaha,* Pali Text Society, London, 1880, p. 48.
15. සයම්පතිත තාලපණ්ණං දිස්වා ආදාය....., *Buddhaghosuppatti*, Ed. James Gray, PTS, London, 1892, p. 59.
16. අථෙකස්මිං දිවසෙ තාලරුළ්හක පුරිසො පණ්ඩිතො ඛ්‍යත්තො කුසලත්තො තස්ස කිරියං දිස්වා අජිද්දං අකණ්ඩං තාලපණ්ණං තස්ස පිණ්ඩපාත ඨානෙ විකිරිත්වා නිලීයි, ථෙරො පිණ්ඩපාතාවසානෙ තං ආදාය ගතො, -*Ibid*- p. 59.
17. තදා ච ආහරාපෙත්වා පහට්ඨො පුඤ්ඤපොත්ථකං
වාචෙතුං ලෙඛනං ආහ සොහං වාචෙසි පොත්ථකං, *මහාවංස*, පරි. 32, 25 ගාථාව
18. *පූජාවලිය*, සංස්. මාබෝපිටියේ මේධංකර ස්ථවිර, 1932, පරි. 34, 8 පිටුව
19. Silva, E.W. 1938, p. 2
20. පැළැනේ වජිරඤාණ හිමි, 'පාළි ඉගෙනීම' පිරිවෙණ, *ධර්ම ශාස්ත්‍රීය පැරණි ලේඛන සංග්‍රහය*, පිරිවෙන් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යංශය, 2016, 30 - 38 පිටු.
21. *අභිසත්තව*, සංස්. අරාවත්තේ නේමින්ද හිමි සහ වෙනත් අය, සිංහලෙන් පිරිත් දෙසීම සුදුසුද?, මැදගොඩ අභයතිස්ස හිමි, අපේස් ග්‍රැපික්ස්, වැලිපිල්ලෑව, 2009, 130-5 පිටු.

22. *ධර්මෝදය ශාස්ත්‍රීය ලිපි සරණිය*, පාලි අධ්‍යයනයෙහි ඇති වැදගත්කම, බෙල්ලන්විල විමලරතන හිමි, සංස්. කහපත්විල අරියනන්ද හිමි සහ වෙනත් අය, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 2003, 95 - 100 පිටු.